

වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

කාර්යසාධන වාර්තාව

2021

වැය ශීර්ෂ අංක - **408**

ගරු ප්‍රසන්න රණවීර මැතිතුමා

වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන
රාජ්‍ය අමාත්‍ය

එම්.ඒ.බී.වී. බණ්ඩාරනායක මහතා

වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

<u>අමාත්‍යතුමාගේ පණිවුඩය</u>



වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය පැවති අභියෝග හමුවේ රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාරව අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් පැවරූ වගකීම් සාර්ථකව ඉටු කිරීමට හැකිවීම පිළිබඳ සතුටට පත් වෙමි.

ලෝකය හමුවේ වූ දැවැන්ත අර්බුදය අපගේ රටට ද එල්ල කළ අභියෝගය සුළු පටු නොවේ. අතිගරු ජනාධිපතිතුමාගේ දර්ශනයට අනුව බොහෝ ක්ෂේත්‍ර හානි අවම වන ආකාරයට පවත්වාගෙන යාමට හැකි වූ බව ද අපි දනිමු.

නව සාමාන්‍යකරණය යටතේ රටේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ඉන් හැකි වී තිබේ. එහෙත් විදේශ විනිමය ගැටලුව සමග රටට මුහුණ පෑමට සිදු වූ ප්‍රායෝගික ගැටලු රාශියකි. ඒ සියල්ල ජනතාවාදීව විසඳීමට රජය හැකි සෑම පියවරක්ම ගනිමින් සිටී.එහි දී මාගේ අමාත්‍යාංශයට පැවරී ඇති කාර්යභාරය ජාතික අභිලාෂයන් මුදුන් පැමිණවීම උදෙසා ඉටු කිරීම වගකීමක් සේ සලකමි.

ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමට ජනතා කේන්ද්‍රීය ආර්ථිකය ශක්තිමත් කිරීම අපගේ එකම අභිප්‍රාය වේ. ඒ සඳහා වන සැලසුම් පියවරෙන් පියවර අමාත්‍යාංශය සහ රේඛීය ආයතන යටතේ ක්‍රියාත්මක වේ. එසේම ඒ වෙනුවෙන් වූ පසුවිපරම ද අඛණ්ඩව සිදු කෙරේ.

ග්‍රාමීය කර්මාන්තකරුවා ප්‍රායෝගිකව මුහුණ පා සිටින බොහෝ ගැටළුවලට වූ විසඳුම් අප හඳුනාගෙන ඇත.

විද්වතුන්, පර්යේෂකයන් සේම සාම්ප්‍රදායික කර්මාන්තවල නියැලී සිටින කර්මාන්තකරුවාගේ වටිනා අත්දැකීම් ද එහි දී අපි ප්‍රමුඛ සේ සලකා කටයුතු කිරීමට වග බලා ගත්තෙමු.

ඒ අනුව, විභවතාව සහිත පුද්ගලයන් හඳුනාගනිමින් ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම ක්‍රියාත්මක වේ. යැපුම් මානසිකත්වයෙන් ඉවත් වුණු ව්‍යවසාය මානසිකත්වයක් ඇති කිරීමෙන් ඔවුන්ව සවිබල ගැන්විය යුතුය. ඉන් ඔවුන් ලබන උත්ප්‍රේරණය අපගේ ඉලක්ක පහසු කරන බව මාගේ අත්දැකීමය.

2021 වර්ෂය සඳහා අමාත්‍යාංශයට වෙන් කරන ලද ප්‍රාග්ධන මුදල් වඩාත් ප්‍රතිඵලදායී ලෙස කළමනාකරණය කරමින් නිවැරදි තැනට නිවැරදි ව දායකත්වය ලබාදීමට ගත් වෙහෙස ප්‍රතිඵලදායකය.

ජාතික ශිල්ප සභාව, විද්‍යා මධ්‍යස්ථානය අමාත්‍යාංශ ඉලක්ක හා අරමුණු වඩාත් නිවැරදිව ජනතාව අතරට ගෙන යාමට සමත් වීම ද සතුට දනවන්නකි.

ග්‍රාමීය කර්මාන්තකරුවාගේ නිෂ්පාදනවල ප්‍රමිතිය ඉහළ නැංවීම සේම නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම ද පවතින ඉල්ලුම් සම්පූර්ණ කිරීම තවදුරටත් ප්‍රතිඵලදායකය.

ජාතික ආර්ථිකයට සේම ග්‍රාමීය ජනතාවගේ සමෘද්ධිය වෙනුවෙන් මාගේ අමාත්‍යාංශයේ කාර්යභාරය ශක්තිමත් කරගැනීමට පාර්ලිමේන්තු පක්ෂ විපක්ෂ මහජන නියෝජිතයන්ගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගයමි.

ප්‍රසන්න රණවීර
රාජ්‍ය අමාත්‍ය
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ලේකම්තුමාගේ පණිවුඩය



වේවැල්, පිත්තල, මැටි, ලී බඩු ඇතුළු පාරම්පරික කර්මාන්තයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින්, එකී කර්මාන්තයන් මුහුණ දෙන අමුද්‍රව්‍ය සපයා ගැනීමේ ගැටළු නිරාකරණය කිරීම, වෙළඳපල සඳහා ඇති බාධක ඉවත් කිරීම, නිෂ්පාදන සඳහා යෝග්‍ය තාක්ෂණය මුසු කිරීම, පුහුණු අවස්ථා සුලභ කිරීම හා පාරම්පරික කර්මාන්තයන් හි නිරත ශිල්පීන්ගේ අභිවෘද්ධිය සලසා දීම සේම ග්‍රාමීය කර්මාන්ත නහාසිටුවීම මූලික අභිප්‍රාය කොට ගෙන ස්ථාපිත කරන ලද වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සිය කාර්යභාරය ඉටු කරන ලද පූර්ණ වසර ලෙස 2021 වසර හඳුන්වා දිය හැකිය.

ගත වූ වසරක කාලය පිළිබඳ විමසා බැලීමේ දී අමාත්‍යාංශය විසින් සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍රයේ හා කර්මාන්තකරුවන්ගේ උන්නතිය උදෙසා සුවිශේෂී කාර්යභාරයක් සිදු කිරීමට හැකි වීම පිළිබඳව සතුටට පත් වෙමී. විශේෂයෙන්ම ග්‍රාමීය කර්මාන්තකරුවන් ව්‍යවසායකයන් ලෙස ඉදිරියට ගෙන ඒමේ දී ඔවුන්ගේ පුහුණු හා තාක්ෂණ අවශ්‍යතා සපුරා දීම සඳහා කටයුතු කිරීමට හැකි වීම, කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ප්‍රමිතිකරණය සඳහා යොමු කිරීම, තාක්ෂණික සායනික සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් කර්මාන්තකරුවන්ගේ තාක්ෂණික ගැටළු විසඳා දීම සඳහා කටයුතු කිරීම ප්‍රමුඛ කාර්යයකි. 2021 වසරේ දී කර්මාන්තකරුවන් 19 දෙනෙකු සඳහා නිෂ්පාදන තත්ත්ව සහතික හා ප්‍රමිති සහතික ලබාදීමට හැකි වීම ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රගමනය සඳහා අප දක්වන ලද දායකත්වයෙන් බිඳකි. එසේම 2021 වසරේ දී මුළු දිවයිනම ආවරණය වන පරිද්දෙන් 518 දෙනෙකු සඳහා තාක්ෂණ සහය ලබා දීමට අමාත්‍යාංශයට හැකි විය. තව ද එක් ගමකට එක් ව්‍යවසායකයෙකු බිහි කිරීම හා ග්‍රාමීය කර්මාන්ත ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන මඟින් 12000 ට ආසන්න කර්මාන්තකරුවන් සංඛ්‍යාවක් නව කර්මාන්තකරුවන් ලෙස ඉදිරියට ගෙන ඒමට අපට හැකි විය.

මීට අමතරව, පාරම්පරික ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරණය පිළිබඳ වෙළඳපල ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා යම්තාක් දුරකට මැදිහත් වීමට අමාත්‍යාංශයට හැකි විය.පළාත් හා ප්‍රාදේශීය අලෙවි අවස්ථා උදා කර දීම, විශේෂිත අලෙවිසැල් පිහිටුවීම, විද්‍යුත් අලෙවි අවස්ථාවන් සඳහා කර්මාන්තකරුවන්ට අවශ්‍ය පහසුකම් ලබා දීම ආදී කාර්යයන් සිදු කිරීමට අමාත්‍යාංශයට හැකි විය.එසේම, ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වගා කිරීමේ වැඩසටහන් දියත් කිරීම, අමුද්‍රව්‍ය බැංකුව ස්ථාපනය කිරීම යටතේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් ඉවතලන අඛලි පිත්තල, තඹ වැනි අමුද්‍රව්‍ය මිල දී ගෙන ඒවා ලියාපදිංචි පාරම්පරික කර්මාන්තකරුවන්ට සහන මිලට ලබා දීම ආදි කාර්යයන් කෙරෙහි මූලිකත්වය ගෙන කටයුතු කිරීමට ගරු අමාත්‍යතුමාගේ නායකත්වය හා මඟ පෙන්වීම සේම නිලධාරීන්ගේ කැපවීම මත සිදු කිරීමට මෙම අමාත්‍යාංශයට හැකි වීම 2021 වසරේ ලද ජයග්‍රහණයක් සේ සැලකිය හැකිය. ඒ සඳහා, පෙළ ගැසුනු මාගේ කාර්යය මණ්ඩලයට, ජාතික ශිල්ප සභාවේ සභාපති ඇතුළු කාර්යය මණ්ඩලය හා ගරු අමාත්‍යතුමන් හා එතුමන්ගේ පෞද්ගලික කාර්යය මණ්ඩලය මේ මොහොතේ දී කෘතවේදීව සිහිපත් කරමි.

එම්.ඒ.බී.වී. බණ්ඩාරනායක
ලේකම්
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

2021 වසරේදී අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන්හි සම්බන්ධීකරණ නොරතුරු

- <u>ජාතික ශිල්ප සභාව</u>

සභාපති	-	සම්පත් ඇරැහැපොළ මහතා
දු. අංක	-	**011 2784425 / 0711738876**
ෆැක්ස්	-	**011 2785720**
විද්‍යුත් තැපෑල	-	**chairmanncc2020@gmail.com**

පටුන පිටු අංක

1. පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 01
   1.1. හැඳින්වීම 03
   1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු 03 - 04
   1.3. අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් 04
   1.4. සංවිධාන සටහන 05
   1.5. අමාත්‍යාංශයේ අංශයන් 06
   1.6. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 07

2. පරිච්ඡේදය 02 - කාර්යසාධනය - 2021 09
   2.1. අමාත්‍යාංශයේ කාර්යසාධනය 2021 11 - 32
   2.2. අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන් හි කාර්යසාධනය 33 - 56

3. පරිච්ඡේදය 03 - 2021 වසර සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය 57
   3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 59 - 60
   3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 61- 62
   3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 63 - 65
   3.4. මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 66
   3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධන 67
   3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය 67
   3.7. මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 67
   3.8. සමුච්චිත මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය 68
   3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව 69 - 73

4. පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක 75 - 78

5. පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය 79
   5.1. ආයතනයට අදාළව හඳුනාගත් තිරසර සංවර්ධන අභිමතාර්ථ 81 - 83
   5.2. තිරසර සංවර්ධන අභිමතාර්ථ ලභා කර ගැනීමේ අභියෝග 84

6. පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 85
   6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 87
   6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟයේ හෝ අතිරික්තයේ බලපෑම 87
   6.3. මානව සම්පත් සංවර්ධනය - 2021 87 - 90

7. පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 91 - 101

පරිච්ඡේදය - 01

ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

- අංක 2187/27 හා 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

- 1982 අංක 35 සහ 1996 අංක 04 දරණ ජාතික ශිල්ප සභා පනත මඟින් ස්ථාපිත කර ඇති ජාතික ශිල්ප සභාව, විද්‍යුතා සම්පත් මධ්‍යස්ථාන හා දැව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානය අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ.

- කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත "දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම අමාත්‍යාංශයේ කාර්යභාරය වේ.

- වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයා ලෙස ප්‍රසන්න රණවීර මැතිතුමා ද අමාත්‍යාංශ ලේකම් ලෙස එම්.ඒ.බී.වී.බණ්ඩාරනායක මහතා ද කටයුතු කරයි.

- මෙම අමාත්‍යාංශය කොළඹ 01, ඇව්ලන් චතුරශ්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, 07 වන මහලෙහි සහ නැගෙනහිර කුළුණෙහි 36 වන මහලෙහි ගරු අමාත්‍ය කාර්යාලය වශයෙන් පිහිටා ඇත.

1.2. වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

පාරම්පරික හා ග්‍රාමීය කර්මාන්ත තුළින් ජාත්‍යන්තර වෙළඳපොල ජයගත් ආසියාවේ කේන්ද්‍රස්ථානය බවට පත්වීම

මෙහෙවර

වේවැල්, පිත්තල, මැටි, ලී බඩු ඇතුළු පාරම්පරික කර්මාන්තයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් දෙස් විදෙස් වෙළඳපොල ජයගත හැකි පරිදි කර්මාන්තයන්ගේ අගය වැඩි කරමින් අමුද්‍රව්‍ය සහ වෙළඳපොල සඳහා ඇති බාධක ඉවත් කරමින් නවීන තාක්ෂණය මුසු පාරම්පරික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම

අරමුණු

- කර්මාන්තකරුවන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ගුණාත්මක තත්වයෙන්, ප්‍රශස්ත පිරිවැයක් යටතේ, දේශීය අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්ට ප්‍රමුඛත්වයක් ලබා දෙමින්, තවදුරටත් වෙළඳපොල අවශ්‍යතාව පවතින අමුද්‍රව්‍ය විදේශීය වෙළඳපොලින් ලබා ගනිමින් අඛණ්ඩ සැපයීම තහවුරු කිරීම.

- ආනයනික ආදේශක භාණ්ඩ වලට තරඟයක් ලබාදෙමින් දේශීය වෙළඳපොල කොටස වැඩි කිරීමටත් විදේශීය වෙළඳපොල ආකර්ෂණය කරගත හැකි නිෂ්පාදනයන් බිහි කිරීම තුළින් එම වෙළඳපොල ග්‍රහණය කරගැනීමටත් පරිසරය නිර්මාණය කිරීම.

- ආනයනික ආදේශක භාණ්ඩ වලින් ඇතිවිය හැකි අහිතකර බලපෑමෙන් ග්‍රාමීය කර්මාන්ත රැක ගැනීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් සැකසීම.

- ග්‍රාමීය කර්මාන්තකරුවන්ට අවශ්‍ය ස්ථාවර ප්‍රාග්ධනය සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පහසුවෙන් හා කඩිනමින් සපයා ගැනීමට අවශ්‍ය පසුබිම සැකසීම.

- පාරම්පරික තාක්ෂණය රැකගනිමින්, ග්‍රාමීය කර්මාන්තවලට අවශ්‍ය නවීන තාක්ෂණය හඳුන්වාදීමට අවශ්‍ය පහසුකම් සැලසීම සහ නවීන තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳව දැනුවත්භාවයෙන් යුතු ග්‍රාමීය කර්මාන්තකරුවන් බිහි කිරීම සඳහා විශ්ව විද්‍යාල හා පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

- පාරම්පරික හා ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍රය සමාජයේ අභිමානවත් ව්‍යාත්තීය ක්ෂේත්‍රයක් බවට පත්කිරීම.

- පාරම්පරික හා ග්‍රාමීය කර්මාන්ත සඳහා හිතකර පරිසරයක් බිහි කිරීමට අවශ්‍ය නීතිරීති සහ ආයතනික රාමුවක් සකස් කිරීම

1.3. අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්

- කර්මාන්ත අමාත්‍යවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත ‘‘දේශීය කර්මාන්ත ගොඩනැගීම සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම’’ සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

1.4. අමාත්‍යාංශයේ සංවිධාන සටහන



1.5. අමාත්‍යාංශයේ අංශයන්



1.6. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

අංක 2187/27 හා 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථයට පහත සඳහන් ආයතනයන් අයත් වේ.

- ජාතික ශිල්ප සභාව (1982 අංක 35 සහ 1996 අංක 04 ජාතික ශිල්ප සභා පනත)
- විදාතා සම්පත් මධ්‍යස්ථාන
- දැව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානය

පරිච්ඡේදය - 02

කාර්යසාධනය 2021

2.1. අමාත්‍යාංශයේ කාර්යසාධනය -2021

2.1.1 පාලන අංශය

අමාත්‍යාංශයේ යහපත් ආයතනික පරිපාලන පරිසරයක් පවත්වාගෙන යාම, මානව හා භෞතික සම්පත් කළමනාකරණය කිරීම, කාර්ය මණ්ඩලයේ වෘත්තීය අවශ්‍යතා ඉටු කිරීම සහ අමාත්‍යාංශයේ සේවාවන් ඉටු කිරීමට සහය වීම පාලන අංශයේ කාර්යභාරය වේ.

2021 වර්ෂය තුළ ආයතන අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

- **කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

අමාත්‍යාංශ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ ඔවුන් සතු විෂය දැනුම පුළුල් කිරීම, යාවත්කාලීන කිරීම හා සේවා අවශ්‍යතා සපුරා ගැනීම යන අරමුණු පෙරදැරි කර ගෙන පාලන අංශය විසින් වාර්ෂිකව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව, 2021 වසර තුළ දී නිලධාරීන් 90 දෙනෙකුගේ සාමාන්‍ය පුහුණු අවශ්‍යතා සපුරාලීමටත්, නිළධාරීන් 110 දෙනෙකු බාහිරගත පුහුණු වැඩසටහනකට සහභාගී කරවීමටත් හැකි විය.

අනු අංකය	පුහුණු පාඨමාලාවේ නම	ආයතනයේ නම	වැය වූ මුදල (රු.)	ප්‍රතිලාභ / පුහුණුව ලද නිලධාරීන් සංඛ්‍යාව
01	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම පිළියෙල කිරීම	සී/ස නිපුණතා සංවර්ධන අරමුදල	5,000.00	01
02	සේවක අභිප්‍රේරණ - බාහිරගත පුහුණුව	තුල්හිරිය ‘‘මාර්ස් හෝල්ඩින්ස්’’ ආයතනය	300,000.00	110
03	සංවර්ධන අධ්‍යනය පිළිබඳ පශ්චාත් උපාධිය (සේවා අවශ්‍යතාව මත)	කොළඹ විශ්ව විද්‍යාලය	172,500.00	01
04	ග්‍රැෆික් ඩිසයින් පාඨමාලාව	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය	49,500.00	02
05	කාර්යාල සටහන් ලිවීම සහ රාජකාරී ලිපි ලිවීම	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	80,000.00	20
06	කණිෂ්ඨ නිලධාරීන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව	මිලෝදා ආයතනය	150,000.00	02
07	ගිණුම්කරණ කාර්යභාරය සහ ප්‍රායෝගික භාවිතය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	80,000.00	10
08	වෙබ් ඩිසයින් පාඨමාලාව	E- Learning ආයතනය	50,000.00	02
09	සහායක කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	96,000.00	12
10	රාජ්‍ය ආයතනවල අවසන් ගිණුම් පිළියෙළ කිරීම සඳහා බලපාන මූලික ගිණුම්කරණ සංකල්ප හා ගිණුම්කරණ ප්‍රමිත	සී/ස නිපුණතා සංවර්ධන අරමුදල	7,000.00	01

අනු අංකය	පුහුණු පාඨමාලාවේ නම	ආයතනයේ නම	වැය වූ මුදල (රු.)	ප්‍රතිලාභ / පුහුණුව ලද නිලධාරීන් සංඛ්‍යාව
11	ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	214,000.00	01
12	නිවාඩු භාර නිළධාරියාගේ කාර්යභාරය හා වගකීම	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	4,000.00	01
13	වාර්ෂික සාමාජික මුදල් ගෙවීම	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය	16,000.00	01
14	එක් ගමකට එක් ව්‍යවසායකයෙක් වැඩසටහනට සම්බන්ධ විදාතා නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන	කර්මාන්ත සේවා කාර්යාංශය	182,500.00	35
15	රාජ්‍ය අංශයේ කාර්යාල ක්‍රම	දුරස්ථ ඉගැනුම් මධ්‍යස්ථානය	10,000.00	02
එකතුව			**1,416,500.00**	**201**

අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය උදෙසා සංවිධානය කරන ලද බාහිරගත පුහුණු වැඩමුළුවක් 2021.04.07 දින තුල්හිරිය "මාර්ස් හෝල්ඩින්ස්" ආයතනයේ "ඇතීනා" පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. මේ සඳහා ගරු රාජ්‍ය අමාත්‍යතුමන්, අමාත්‍යාංශ ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන් සහභාගී විය.







බාහිරගත පුහුණු වැඩමුළුවේ අවස්ථාවන්

- **පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම**

2187/27 හා 2020.08.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් විද්‍යා සම්පත් මධ්‍යස්ථාන හා එම කාර්ය මණ්ඩලයේ පාලන කටයුතු මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් විය. එහිදී, පෞද්ගලික ලිපිගොනු 1000 කට ආසන්න ප්‍රමාණයක නඩත්තු කටයුතු අමාත්‍යාංශයේ පාලන අංශය වෙත පැවරිණි. ඒ අනුව, අදාළ කාර්ය මණ්ඩල සඳහා වසර ගණනක හිඟ වැටුප් වර්ධක ලබාදීම, ශ්‍රේණි උසස් කිරීම, වැටුප් පරිවර්තනය කිරීම, විශ්‍රාම ගැන්වීම, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම ආදී කටයුතු රැසක් 2021 වසර තුළ දී සිදු කරන ලදී.

විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් අතරින් වඩාත් සුදුසුකම් සහිත නිලධාරීන් 25 දෙනෙකු දිස්ත්‍රික් විද්‍යා නිලධාරීන් ලෙස උසස් කිරීම, විද්‍යා අංශයේ හා විද්‍යා සම්පත් මධ්‍යස්ථානවල සේවයේ නියුතු විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් 70 දෙනෙකු II ශ්‍රේණියට උසස් කිරීම හා එයට අදාළ වැටුප් පරිවර්තන කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කර, අදාළ ගෙවීම් කටයුතු සිදු කිරීමට කටයුතු කරන ලදී.

කාර්යාල කම්කරු සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන් අතුරින් 20 දෙනෙකු II ශ්‍රේණියට උසස් කිරීමට අදාළ කටයුතු හා සේවයේ ස්ථිර නොකළ නිලධාරීන් සේවයේ ස්ථිර කිරීම, වැටුප් පරිවර්තන හා රාජ්‍ය භාෂා ප්‍රවීණතාවෙන් නිදහස් කිරීමේ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට මෙම වසර තුළ දී හැකියාව ලැබුණි.

මෙයට අමතරව, 100 කට ආසන්න අමාත්‍යාංශ කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනුවලට අදාළ සියළුම නඩත්තු කටයුතු සිදු කිරීම පාලන අංශය මඟින් සිදු කෙරේ.

- **නිලධාරීන් සඳහා කාර්යාල උපකරණ අවශ්‍යතාව සපුරාලීම**

වසංගත තත්වය හමුවේ විද්‍යා සම්පත් මධ්‍යස්ථානවල කාර්යභාරය අඛණ්ඩව පවත්වා ගෙන යාම හා අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කාර්යයන් ඵලදායී ලෙස සිදු කිරීම සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දීමේ වැඩසටහනක් මෙම වසරේ දී සිදු කෙරිණි. මේ යටතේ දිවයින පුරා පිහිටි විද්‍යා සම්පත් මධ්‍යස්ථාන වෙත රවුටර් හා සිම්පත් ලබා දීම සිදු කරන ලදී.

එමෙන්ම, අමාත්‍යාංශයේ ආයතන අංශය මඟින් සිදු කරනු ලබන කාර්යයන් හි කාර්යක්ෂමතාවය තවදුරටත් ඉහළ නංවා ගැනීමේ අරමුණින් ඒම අංශයේ අවශ්‍යතාවයන් සඳහා පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර හා සමස්ථ අමාත්‍යාංශයේ පරිහරණය සඳහා ඩුප්ලෝ යන්ත්‍රයක් ලබා ගැනීම සිදු කරන ලදී.

ඊට අමතරව ගරු රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර මැතිතුමාගේ මහජන දිනය පැවැත්වීම සඳහා බත්තරමුල්ල "අපේ ගම" පරිශ්‍රයෙහි ලක්සල අලෙවි ප්‍රදර්ශනාගාරයෙහි ඉහළ මහල ජල, විදුලිය සහිතව අංග සම්පූර්ණ කාර්යාලක් ලෙස සකස් කරන ලදී.

2.1.2 ගිණුම් අංශය

මෙම අංශය මඟින් මූල්‍ය සේවා සැපයීමේ කටයුතු සහ අදාළ අංශ සම්බන්ධීකරණය කිරීමෙන් අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන් සඳහා සාධනීය මූල්‍ය තොරතුරු සහ මූල්‍ය කළමනාකරණ පද්ධතියක් සකස් කර ඊට අදාළ කටයුතු පවත්වා ගෙන යාම සිදු කරනු ලබයි.

2021 වසර තුළ ගිණුම් අංශය මඟින් සිදු කරන ලද කාර්යභාරය පහත පරිදි වේ.

- **සියළුම ගෙවීම් කටයුතු සිදු කිරීම හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම**

2021 වර්ෂය තුළ රජයේ මූල්‍ය නීතිරීති සහ මුදල් රෙගුලාසිවලට අනුකූලව අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ වැටුප්, අතිකාල, ගමන් වියදම්, ණය අත්තිකාරම් ගෙවීම් ඇතුළු අනෙකුත් සියළුම ගෙවීම් කටයුතු සිදු කිරීම, ගිණුම්ගත කිරීමට අදාළ ලේඛන පවත්වාගෙන යාම හා නිසිලෙස යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු කිරීම, අත්තිකාරම් "බී" ගිණුම හා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම ආදී සියළු කටයුතු මෙම අංශය විසින් සිදු කරන ලදී.

- **අක්මුදල් හා ප්‍රතිපාදන මුදා හැරීම**

දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ස්ථාපිත කර ඇති සියළුම විද්‍යා මධ්‍යස්ථානවල පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන නිදහස් කිරීම හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රතිපාදන අදාළ ආයතන වෙත මුදා හැරීමේ කටයුතු සහ අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ශිල්ප සභාව වෙත මුදල් ප්‍රතිපූර්ණය කිරීම සිදු කරන ලදී.

- **වාර්ෂික ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම**

2021 වර්ෂයට අදාළව අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් සහය දැක්වීම සිදු කෙරිණි.

- **අදාළ වාර්තා, ගිණුම් සහ තොරතුරු ඉදිරිපත් කිරීම**

මෙම වර්ෂය තුළ විවිධ විෂයයන්ට අදාළව ජාතික අයවැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වෙමින් අදාළ වාර්තා, ගිණුම් සහ තොරතුරු නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

- **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදු කිරීම**

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීම හා ඒ පිළිබඳව වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම ද මෙම අංශය මඟින් සිදු කරනු ලබන අතර, 2021 වර්ෂයට අදාළව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා අදාළ වාර්තා ඉදිරිපත් කර ඇත.

2.1.3 සැලසුම් අංශය

සැලසුම් අංශය අමාත්‍යාංශයේ හා ඊට අයත් ආයතනවලින් සිදු කෙරෙන සංවර්ධන කාර්යන් හි සඵලතාව, කාර්යක්ෂමතාව, භෞතික හා මූල්‍ය ප්‍රගතිය සමාලෝචනය කිරීම, ඇගයීම හා වාර්තා කිරීම සිදු කරනු ලබන අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, කාර්යසාධන වාර්තා පිළියෙල කිරීම, කෙටිකාලීන, මධ්‍යකාලීන සංවර්ධන වැඩසටහන්වලට අදාළ ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීම සහ අනෙකුත් ප්‍රගති වාර්තාවන් සකස් කොට ඉහළ කළමණාකාරීත්වය හා අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි.

2021 වර්ෂයේ දී මෙම අංශය විසින් ඉටු කරනු ලද කාර්යභාරය පහත පරිදි වේ.

- **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 අනුව රජයේ සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් තම ආයතනය වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේ අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වේ. ඒ අනුව 2021 මූල්‍ය වර්ෂය සඳහා අමාත්‍යාංශයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට අදාළ සියළු කටයුතු සඳහා මූලිකත්වය ගෙන කටයුතු සිදු කරන ලද අතර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශිල්ප සභාවේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම හා අනුමත කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

- **වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ප්‍රගති වාර්තාව පිළියෙල කිරීම**

2020 වර්ෂයට අදාළව අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් හි කාර්යසාධනය ඇතුළත් කරමින් වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කොට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

එමෙන්ම, 2021 වර්ෂයේ මෙම අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනය විසින් අත්කරගත් ප්‍රගතිය හා 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ඇතුළත් ‘‘ප්‍රගති වාර්තාව 2021 සහ ක්‍රියාකාරී සැලැස්ම 2022’’ පිළියෙල කොට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

- **අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ප්‍රගති සමාලෝචනය සිදු කිරීම**

2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල ප්‍රගතිය කාර්තුගතව සමාලෝචනය කරන ලදී.

මෙයට අමතරව, අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීමේ කටයුතු ද සැලසුම් අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.

පැවැති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ මෙම ප්‍රගති සමාලෝචන රැස්වීම් මාලාව මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද අතර එහි දී, සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම හා දිස්ත්‍රික් මට්ටමින් උද්ගත වී ඇති ගැටළු සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම ලබා දීම ද සිදු කෙරිණි. මෙම රැස්වීම් මාලාව අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් හා අදාළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලද අතර දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිද්දෙන් ක්‍රියාත්මක කෙරිණි.









- **ග්‍රාමීය ආර්ථිකය නගාසිටුවීමේ ජාතික වැඩසටහනට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ මෙහෙයවීමෙන් සිදුකරනු ලබන ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ ජාතික වැඩසටහනට අදාළ සම්බන්ධීකරණ කටයුතු මෙම අංශය විසින් සිදුකරනු ලබයි. මෙයට සමගාමීව දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන දේශීය නිෂ්පාදන හා කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුවේ සම්බන්ධීකරණ කටයුතු ද මෙම අංශය මඟින් ක්‍රියාත්මක කෙරේ.

- **ග්‍රාමීය කර්මාන්තකරුවන් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරීම**

දිවයින පුරා ව්‍යාප්තව ඇති ග්‍රාමීය කර්මාන්තයන් හා එම කර්මාන්තයන් හි නියැලෙන කර්මාන්තකරුවන් පිළිබඳ තොරතුරු නොමැති වීම මෙම අමාත්‍යාංශය ආරම්භයේ සිටම මුහුණ දුන් ගැටළුවක් වූ හෙයින් ග්‍රාමීය කර්මාන්තකරුවන් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබා ගෙන අදාළ දත්ත පද්ධතිය සකස් කිරීමේ කටයුතු මෙම අංශය විසින් ආරම්භ කරන ලදී. මේ වන විට ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍ර 22 අදාළව කර්මාන්තකරුවන් 19,000 ක තොරතුරු ඉහත කී දත්ත පද්ධතියට ඇතුළත් කර ඇත.

- **2022 වර්ෂය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට නියමිත නව සංවර්ධන වැඩසටහන් සඳහා ව්‍යාපෘති යෝජනා පිළියෙල කිරීම හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම**

“සෞභාග්‍යයේ දැක්ම” ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව, මෙම අමාත්‍යාංශයේ විෂය පථය ආවරණය වන පරිද්දෙන් පහත සංවර්ධන වැඩසටහන් 08 ක්‍රියාත්මක කිරීමට අදාළව ව්‍යාපෘති වාර්තා පිළියෙල කර ඒ සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙන් එකඟතාව ලබා ගැනීම හා අදාළ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු සිදු කරන ලදී.

- එක් ගමකට එක් ව්‍යවසායකයෙක් බිහි කිරීම හා ඒ තුළින් හඳුනා ගත් ව්‍යවසායකයින් අතුරින් තෝරා ගත් සාර්ථක ග්‍රාමීය කර්මාන්තකරුවන් දේශීය සුපිරි වෙළඳසැල් ජාලය හා විදේශ වෙළඳපල සඳහා භාණ්ඩ සපයන සුළුලදායී කර්මාන්තකරුවන් ලෙස බලගැන්වීමේ වැඩසටහන
- ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන
- ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන
- හස්ත කර්මාන්ත නවෝත්පාදන ඉගැනුම් මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම
- ජාතික අමුද්‍රව්‍ය බැංකුව ස්ථාපනය කිරීම
- ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වගා කිරීමේ වැඩසටහන
- දැව නිෂ්පාදන ආශ්‍රිත මෝස්තර හා ක්‍රියාවලි නව්‍යකරණ මධ්‍යස්ථානය පිහිටුවීම
- ජාතික ලෝකුරු කර්මාන්ත සංවර්ධන වැඩසටහන

2.1.4 විදාතා අංශය

විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සිදු කරන පර්යේෂණ තුළින් හඳුන්වාදෙන නවීන තාක්ෂණය ගම් මට්ටමට ගෙන යාමේ අරමුණින් විදාතා වැඩසටහන 2000 වර්ෂයේදී ආරම්භ කරන ලදී. විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති විදාතා වැඩසටහන අංක 2187/27 හා 2020.08.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ විෂය පථයට අයත් විය.

දේශීය හා විදේශීය වෙළඳපල ජයගැනීම සඳහා යෝග්‍ය තාක්ෂණය පැවරීම, ගුණත්වය ඉහළ නැංවීම, නිෂ්පාදන ප්‍රමිතිගත කිරීම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයින් තිරසාර ලෙස සවිබල ගැන්වීමේ අරමුණ පෙරදැරි කරගෙන 2021 වසරේ දී පහත සඳහන් කාර්යභාරය සිදු කරන ලදී.

- **එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහිකිරීමේ වැඩසටහන**

එක් ග්‍රාම නිලධාරී වසමකින් අවම වශයෙන් එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් ඇතුළත් වන පරිදි ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයින් 14016 දෙනෙකු බිහිකිරීමේ අරමුණ ඇතිව වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ප්‍රධාන ජාතික වැඩසටහන ලෙස 2021 වසරේ දී මෙම වැඩසටහන ආරම්භ කරන ලදී.

වැඩසටහන වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු. මි. 800 කි.

මෙම වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් හා විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්ගේ සක්‍රීය දායකත්වයෙන් ක්‍රියාත්මක විය. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් වෙත ලබා දීම මූලික වශයෙන් සිදු කරන ලද අතර පළාත් මට්ටමින් සියලුම විදාතා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 09 ක් පවත්වන ලදී.





ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන පුද්ගලයින් තෝරා ගැනීමෙන් පසු ඔවුන් ඒ සඳහා සුදුසු තත්ත්වයට ගෙන ඒමට න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු ලබා දීම සඳහා අමාත්‍යාංශයේ විදාතා අංශය විසින් විද්වත් මණ්ඩලයකගේ සහභාගීත්වයෙන් මූලික පුහුණු සැලැස්මක් පිළියෙල කරන ලදී. එම පුහුණු සැලැස්මට අනුව ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ සම්පත් දායකයින්ගේ සහභාගීත්වය ඇතිව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී.

එහෙත් රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සඳහා ජනතාව ඒකරාශී කිරීම අත්හිටුවීම හා සංචරණ සීමාවන් පැනවීම වැනි ක්‍රියාමාර්ගයන් නිසා සාමාන්‍ය පරිද්දෙන් ඔබ්බට ගොස් විකල්ප ක්‍රමවේදයන් අනුගමනය කරමින් එකී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබිණි. එහි දී, මාර්ගගත (Online) ක්‍රමවේදය ඔස්සේ Zoom තාක්ෂණය භාවිත කිරීම, Microsoft teams වැනි වීඩියෝ තාක්ෂණ ක්‍රම අනුගමනය කරමින් ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ඉහළ ප්‍රතිලාභී දායකත්වයක් යටතේ පැවැත්වීමට කටයුතු කර ඇත.

පුහුණු වැඩසටහන් සාර්ථකව නිමා කරන ලද හා 25% ප්‍රතිලාභී දායකත්වය ලබා දුන් කර්මාන්තකරුවන් 11657 ක් සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම සිදු කරමින් 83% භෞතික කාර්යසාධනය ළඟා කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය මඟින් පියවර ගනු ලැබිණි.

- **විදාතා යූ ටියුබ් (You Tube) නාලිකාව ආරම්භ කිරීම**

ව්‍යවසායකත්වය පිළිබඳ විශේෂඥ මඩුල්ලකගේ දැනුම හා ශ්‍රී ලාංකේය ව්‍යාපාරික ක්ෂේත්‍රයේ සාර්ථක ව්‍යාපාරිකයින්ගේ අදහස් ක්ෂේත්‍රයට පිවිසෙන නවක කර්මාන්තකරුවන් වෙත සම්ප්‍රේෂණය කිරීම, කර්මාන්තකරුවන්ගේ දිගුකාලීන පුහුණු අවශ්‍යතාව සපුරාලීම හා ව්‍යවසායකයන් තුළ ක්ෂේත්‍රය පිළිබඳ අභිප්‍රේරණය ඇති කිරීම ආදි අරමුණු ඇතිව YouTube නාලිකාවක් "විදාතා" නමින් ආරම්භ කර එය ව්‍යවසායකයින්ට පරිශීලනය කිරීම සඳහා අන්තර්ජාලයට යොමු කිරීම විදාතා අංශය විසින් 2021 වසරේ දී සිදු කරන ලදී.

මෙය අන්තර්ජාලයට මුදා හැරීම වේවැල්, පිත්තල, මැටි, ලී බඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු ප්‍රසන්න රණවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ ලේකම්, විදාතා අධ්‍යක්ෂ හා අනෙකුත් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදී.





- **තාක්ෂණික සායනික සත්කාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන හා එම කර්මාන්තයන් හි පවතින තාක්ෂණික ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා සහය ලබා දීමේ අරමුණ ඇතිව තාක්ෂණික සායනික සත්කාර වැඩසටහන විදාතා අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහන සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන අතර අදාල දිස්ත්‍රික්කයේ පැවැත්වීමට කටයුතු කිරීම ද විශේෂත්වයකි. ඒ අනුව, රත්නපුර, කොළඹ, ගම්පහ හා මාතර යන දිස්ත්‍රික්කයන් හි ඉහත වැඩසටහන සාර්ථකව පවත්වන ලද අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සෙසු දිස්ත්‍රික්කයන් හි මෙම වැඩසටහන සාමාන්‍ය පරිද්දෙන් ඔබ්බට ගොස් මාර්ගගත ක්‍රමවේදය අනුගමනය කරමින් (Zoom තාක්ෂණය ඔස්සේ) පවත්වන ලදී.

කාර්මික තාක්ෂණ ආයතනය (ITI), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI), ජාතික ශිල්ප සභාව (NCC), ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERD), ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) හා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) යන ආයතන මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ලබා දෙනු ලැබේ.

මෙම වැඩසටහන වෙනුවෙන් රු. මි. 5 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.







ගම්පහ දිස්ත්‍රික් තාක්ෂණික සායනික සත්කාර වැඩසටහන

තාක්ෂණික සායනික සත්කාර වැඩසටහන සඳහා දිස්ත්‍රික් මට්ටමින් කර්මාන්තකරුවන්ගේ සහභාගීත්වය පහත පරිදි වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	සහභාගී වූ සංඛ්‍යාව
1	කොළඹ	92
2	ගම්පහ	107
3	මහනුවර	130
4	අනුරාධපුරය	160
5	බදුල්ල	144
6	හම්බන්තොට	74
7	කෑගල්ල	134
8	කළුතර	165
9	නුවරඑළිය	42
10	ගාල්ල	180
11	රත්නපුර	123
12	පුත්තලම	95
13	කුරුණෑගල	78
15	පොළොන්නරුව	80

අනු අංකය	දිස්ත්‍රික්කය	සහභාගී වූ සංඛ්‍යාව
16	මුලතිව්	70
17	මොණරාගල	85
18	මාතර	198
19	මාතලේ	162
එකතුව		2119

මෙයට අමතරව, වව්නියාව, මුලතිව්, ත්‍රිකුණාමලය, අම්පාර යන දිස්ත්‍රික්කයන් සඳහා සිංහල මාධ්‍යයෙන් කර්මාන්තකරුවන් 50කගේ සහභාගීත්වයෙන් හා යාපනය, මන්නාරම, කිලිනොච්චි, වව්නියාව, මඩකලපුව, ත්‍රිකුණාමලය, අම්පාර යන දිස්ත්‍රික්කයන් සඳහා දමිළ මාධ්‍යයෙන් කර්මාන්තකරුවන් 175කගේ සහභාගීත්වයෙන් Zoom තාක්ෂණය ඔස්සේ තාක්ෂණික සායනික සත්කාර වැඩසටහන් පැවැත්වීමට මෙම අංශය විසින් කටයුතු කර ඇත.

- **ග්‍රාමීය කර්මාන්තකරුවන් සඳහා තාක්ෂණික සහය ලබා දීම හා දැනුම් හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම්වලට අනුව ප්‍රාදේශීය මට්ටමින් ග්‍රාමීය කර්මාන්ත පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රයෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම විදාතා අංශය මඟින් සිදු කරයි. ඒ අනුව, 2021 වසරේ පුහුණුවලත් කර්මාන්තකරුවන් සංඛ්‍යාව 8537 කි.

පුහුණු වැඩසටහන් පැවැත්වීමට අමතරව කර්මාන්තකරුවන් ග්‍රාමීය කර්මාන්ත ක්ෂේත්‍රය තුළ රඳවා ගැනීම හා දිරිගැන්වීම උදෙසා ඔවුන්ට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම ද අමාත්‍යාංශය මඟින් සිදු කරයි. ඒ අනුව, දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ලක්ම පාහේ ආවරණය වන පරිද්දෙන් ඉහත වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා ප්‍රතිලාභ ලබා දීම ද සිදු කරන ලදී. එහි දී, රජයේ දායකත්වය උපරිමය රු. 100,000.00කට යටත්ව මුළු වටිනාකමින් 75% ක් ලෙසද, ඉතිරි 25% ප්‍රතිලාභියාගේ දායකත්වය ලෙසද නව කර්මාන්තයක් ආරම්භ කිරීම සඳහා හෝ කර්මාන්ත වැඩිදියුණු කිරීම සඳහා යන්ත්‍රසූත්‍ර හා උපකරණ ලබා දීම මෙම වැඩසටහන තුළින් සිදු කෙරිණි.

මෙම ව්‍යාපෘතියේ සමස්ථ වටිනාකම රු.මි. 36.48 කි.

ග්‍රාමීය කර්මාන්තකරුවන් සඳහා තාක්ෂණික සහය ලබාදීම පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	කොළඹ	25
2	ගම්පහ	126
3	මහනුවර	26
4	අනුරාධපුරය	21
5	බදුල්ල	24
6	හම්බන්තොට	37
7	කෑගල්ල	29
8	කළුතර	21

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
9	නුවරඑළිය	9
10	ගාල්ල	15
11	රත්නපුර	14
12	පුත්තලම	14
13	කුරුණෑගල	54
14	අම්පාර	2
15	පොළොන්නරුව	3
16	මුලතිව්	2
17	කිලිනොච්චි	2
18	යාපනය	9
19	මොණරාගල	9
20	මන්නාරම	1
21	මාතර	54
22	මාතලේ	17
23	ත්‍රිකුණාමලය	4
එකතුව		518









- **ප්‍රාදේශීය මට්ටමින් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ප්‍රාදේශීය මට්ටමින් ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතා අනුව කණ්ඩායම් වශයෙන් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම වැඩසටහන යටතේ සිදුකරන ලදී.

ඒ අනුව. 2021 වර්ෂයේ දී පහත සඳහන් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	විශේෂ ව්‍යාපෘතිය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මූල්‍ය වටිනාකම (රු.මි.)
01	කුරුණෑගල	අලව්ව	ඉදල් සහ කොසු නිෂ්පාදනය	10	1.7
02	කළුතර	පාලින්දනුවර	සුදු පොල්තෙල් නිෂ්පාදනය	05	0.42

- **ග්‍රාමීය කර්මාන්ත නිෂ්පාදන සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තා සහ ප්‍රමිති සහතික ලබා දීම**

ග්‍රාමීය කර්මාන්ත නිෂ්පාදන ගුණත්වය ඉහළ නැංවීම, පාරිභෝගික ආකර්ෂණය හා පහසුවෙන් වෙළඳපොල අවස්ථා ළඟා කර ගැනීම සඳහා හේතු වේ. ඒ අනුව, තෝරා ගත් ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තා සහ ප්‍රමිති සහතික ලබා දීමට අවශ්‍ය කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කරන ලද අතර මේ සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ (ITI) හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ (SLSI) සහයෝගීතාවය ලබා ගන්නා ලදී.

මෙම වැඩසටහන වෙනුවෙන් වැය කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 18.52 කි.

අනු අංකය	ප්‍රමිති සහතිකකරණ වර්ගය	යොමු කර ඇති නිෂ්පාදන සංඛ්‍යාව
01	විදාතා පද්ධති සහතිකකරණය (VSC) සහතිකකරණය	57
02	යහපත් කළමනාකරණ ක්‍රමවේදයන් (GMP) සහතිකකරණය	141
03	ශ්‍රී ලංකා ප්‍රමිති (SLS) සහතිකකරණය	05





- **විදාතා සම්පත් මධ්‍යස්ථානවල ධාරිතා සංවර්ධනය**

දිවයින පුරා පිහිටි විදාතා සම්පත් මධ්‍යස්ථාන, ප්‍රාදේශීය මට්ටමින් ග්‍රාමීය කර්මාන්තකරුවන් සඳහා සුවිශේෂී සේවාවන් සලසන ආකර්ශනීය ස්ථානයන් බවට පත්කිරීමේ අරමුණින් 2021 වසරේ දී විදාතා මධ්‍යස්ථානවල ධාරිතා සංවර්ධන කටයුතු සිදු කරන ලදී. ඒ යටතේ, නව පත්වීම් ලද දිස්ත්‍රික් විදාතා නිලධාරීන්ගේ කටයුතු පහසු කිරීම සඳහා අවශ්‍ය කාර්යාලයීය උපකරණ ලබා දීම සිදු කරන ලද අතර විදාතා සම්පත් මධ්‍යස්ථාන 40 ක අළුත්වැඩියා කටයුතු සහ විදාතා සම්පත් මධ්‍යස්ථාන 46 ක් සඳහා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම 2021 වසරේ අවසන් කරන ලදී.

මෙම වැඩසටහන වෙනුවෙන් රු. මි. 35 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

- **ග්‍රාමීය කර්මාන්ත නිෂ්පාදනවල අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා අලෙවි පහසුකම් සැපයීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන ආරම්භ කරන ලදී.

මෙම වැඩසටහන වෙනුවෙන් රු. මි. 30 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

මේ යටතේ ;

- ප්‍රාදේශීය මට්ටමින් හරිත කඩමණ්ඩිය අලෙවිපොළ 21 ක් සහ සතිපොළ 38 ක් පැවැත්වීම
- විදාතා මධ්‍යස්ථාන 21 ක් සඳහා අලෙවි පහසුකම් සඳහා අවශ්‍ය වන භාණ්ඩ හා උපකරණ ලබා දීම
- විදාතා මධ්‍යස්ථාන 274 ක් සඳහා නාමපුවරු සවි කිරීම
- විදාතා අංශය වෙනුවෙන් පසුබිම් තිරයක් සහ කොඩි නිර්මාණය කර ගැනීම
- අලෙවි ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික උපකරණ මිලදී ගැනීම
- ග්‍රාමීය කර්මාන්තකරුවන් සඳහා ප්‍රයෝජනවත් වන ග්‍රන්ථ මුද්‍රණය කිරීම

එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහි කිරීමේ වැඩසටහන සඳහා අමාත්‍යාංශය මගින් ලබා දෙන රාජ්‍ය අනුග්‍රහයට අමතරව, ව්‍යවසායකයින්ගේ මූල්‍ය දුෂ්කරතා මගහරවා ගැනීමට රාජ්‍ය බැංකු හා අනෙකුත් රාජ්‍ය ආයතන මගින් හඳුන්වාදෙන සහන ණය යෝජනා ක්‍රම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙනුවෙන් හඳුන්වාදෙන ණය යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු ඇතුළත් පොතක් මුද්‍රණය කරන ලදී.





ව්‍යවසායකයින්ට පරිශීලනය කිරීම සඳහා ආහාර තාක්ෂණය පිළිබඳ තොරතුරු ඇතුළත් "දිවිමගට පෙරවදනක්" පොතේ පළවන වෙළුම මුද්‍රණය කරන ලදී.





2.1.5 සංවර්ධන අංශය

මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කර්මාන්තයන් හි අභිවෘද්ධිය උදෙසා සිදු කරනු ලබන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රධාන ආයතනයන් මඟින් සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන් සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම, නියාමනය කිරීම, ප්‍රතිපත්තිමය මහපෙන්වීම, සහය ලබා දීම හා දේශීය හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන් හි සම්බන්ධීකරණ, මෙහෙයුම් හා නියාමන කටයුතු සංවර්ධන අංශය මඟින් සිදු කරනු ලබයි.

එහි දී, ජාතික ශිල්ප සභාව මඟින් ක්‍රියාත්මක කරන ලද_ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වගා කිරීමේ වැඩසටහන, ජාතික අමුද්‍රව්‍ය බැංකුව ස්ථාපනය කිරීම, ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන හා ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපළ ප්‍රවර්ධනය කිරීම ආදි වැඩසටහන් අධීක්ෂණය කිරීම, නියාමනය කිරීම හා අවශ්‍ය සම්බන්ධීකරණය මෙම අංශය මඟින් සිදු කරන ලදී. විශේෂයෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය ඇතුළු රාජ්‍ය ආයතන හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, මොරටුව විශ්ව විද්‍යාලය ආදී තාක්ෂණ හා පර්යේෂණ කාර්යය සිදු කරනු ලබන විශ්ව විද්‍යාල පද්ධතිය හා ඒකාබද්ධව අමාත්‍යාංශයේ මෙහෙවර ළඟා කර ගැනීම සඳහා කටයුතු කරන ලදී. තව ද අමුද්‍රව්‍ය සැපයීමට ඇති නෛතික බාධා ඉවත් කිරීම, නිෂ්පාදන අලෙවිකරණ අභියෝග ජය ගැනීම, දේශීය නිෂ්පාදන ප්‍රචලිත කිරීමට පියවර ගැනීම, ග්‍රාමීය හා සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සංවර්ධනය තුළින් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා අදාළ ආයතන සමඟ කටයුතු කිරීම 2021 වසර තුළ සිදු කරන ලදී.

ඒ අනුව, මෙම අංශය විසින් සිදු කරන ලද කාර්යභාරය පහත පරිදි පෙළගස්වා ඉදිරිපත් කෙරේ.

- **සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරීම**

මෙරට සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන හා එම ගම්මානවල සිදු කෙරෙන නිෂ්පාදන පිළිබඳව තොරතුරු සපයාගත නොහැකි වීම සංවර්ධන ක්‍රියාවලියේ දී තීරණ ගැනීම කෙරෙහි ගැටළුකාරී වන හෙයින් අමාත්‍යාංශයේ මැදිහත් වීම මත ග්‍රාමීය හා සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන පිළිබඳ තොරතුරු රැස්කරමින් ඒ පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීමේ කටයුතු සංවර්ධන අංශය විසින් ආරම්භ කර ඇත. මෙම දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු දිවයිනම ආවරණය වන පරිදි සෑම දිස්ත්‍රික්කයක් තුළින්ම ලබා ගැනීමට මෙම අංශය කටයුතු කළ අතර ඒ අනුව අමාත්‍යාංශයේ

ඉදිරි සංවර්ධන කටයුතුවල දී පරීශීලනය සඳහා සේම විද්‍යාර්ථීන්ගේ පරිශීලනය සඳහා මෙම දත්ත පද්ධතිය උපයෝගී වනු ඇත.

මෙයට අමතරව ශ්‍රී ලංකාවේ මැටි නිධි පිළිබඳ තොරතුරු ද මෙම අංශය මඟින් ඒකරාශී කරමින් පවතී.

- **ලී බඩු නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම**

අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය හඳුන්වාදිය හැකි අතර මෙහි අරමුණු පහත පරිදි වේ.

- දැව අංශයේ නවෝත්පාදන ආශ්‍රිත දැනුම සැලසුම් කිරීම හා ක්‍රියාවට නැංවීම
- දැව අංශයේ අඛණ්ඩ පර්යේෂණ හා සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම
- පර්යේෂණයන් හි හඳුනාගෙන ඇති ව්‍යාපාරික පාර්ශවකරුවන් අතර දැනුවත්භාවය ඇති කිරීම සඳහා පාර්ශවකරුවන්, අනාගත ආයෝජකයින් සහ ශිල්පීන් එකම වේදිකාවක් තුළට ගෙන ඒම
- ගෘහ භාණ්ඩ කර්මාන්කරුවන්ට නවීන දැව පරීක්ෂණ උපකරණ සහ පහසුකම් හඳුන්වා දීම
- ඩිජිටල් අලෙවිය සහ අතථ්‍ය සාප්පු සවාරි සඳහා වේදිකාවක් ස්ථාපිත කිරීම
- දැව පදනම් කරගත් නිෂ්පාදන සඳහා ප්‍රමිති සහතික කිරීම

මෙම වැඩසටහන සඳහා 2021 වසරේ දී අමාත්‍යාංශයට වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 60 ක් වූ අතර එම ප්‍රතිපාදන පහත ක්‍රියාකාරකම් වෙනුවෙන් යොදවන ලදී.

සිදු කරන ලද සංවර්ධන කාර්යයන්	**මූල්‍ය වටිනාකම (රු. මි.)**
දැව ආශ්‍රිත නවෝත්පාදන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලීන් සම්බන්ධව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමඟ කටයුතු කිරීම	3.3
දැව මෝස්තර නවෝත්පාදන මධ්‍යස්ථානය සඳහා උපකරණ මිලදී ගැනීම	4.59
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 87ක වඩු කර්මාන්තකරුවන් 765දෙනෙකු සවිබල ගැන්වීම සඳහා උපකරණ සැපයීම	52.1
එකතුව	60

දැව ආශ්‍රිත නවෝත්පාදන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලීන් සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මඟින් දැව සැකසුම් ක්‍රියාවලි මධ්‍යස්ථානයක් (Timber Process Innovation Centre) ස්ථාපිත කිරීම සඳහා ඉදිරිපත් කර ඇති යෝජනාවලියට අමාත්‍යාංශයේ එකඟත්වය පළ වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම සිදු කර ඇත. එම ගිවිසුම ප්‍රකාරව පහත සඳහන් සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතී.

- දැව පර්යේෂණාගාරය ස්ථාපනය හා පර්යේෂණ පහසුකම් සැලසීම
- ආනයනික දැව හා දේශීය ගෘහ භාණ්ඩවල ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා මාර්ගෝපදේශ සැකසීම
- දැව නිෂ්පාදන වර්ගීකරණය, ලියාපදිංචි කිරීමේ සමීක්ෂණය සහ අලෙවිකරණ වේදිකාවක් සංවර්ධනය කිරීම

- **ලී බඩු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයන් හි නිරතවන ග්‍රාමීය කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම**

එක් ගමකට එක් ව්‍යවසායකයෙක් බිහි කිරීමේ වැඩසටහනට සමගාමීව දිස්ත්‍රික් මට්ටමින් ලී බඩු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයන් හි නිරතවන ග්‍රාමීය කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට අදාළ කටයුතු සංවර්ධන අංශය මඟින් සිදු කරන ලදී. මේ යටතේ ප්‍රතිලාභීන් 765 ක් සඳහා ප්‍රතිලාභ ලබා දීමට හැකි විය.

අනු අංකය	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	මධ්‍යම පළාත	නුවර	9
		මාතලේ	10
02	උතුරු මැද පළාත	අනුරාධපුරය	12
		පොළොන්නරුව	16
03	වයඹ පළාත	කුරුණෑගල	218
		පුත්තලම	45
04	සබරගමු පළාත	කෑගල්ල	15
		රත්නපුර	16
05	දකුණු පළාත	ගාල්ල	56
		හම්බන්තොට	131
		මාතර	5
06	ඌව පළාත	බදුල්ල	46
07	බස්නාහිර පළාත	කොළඹ	18
		ගම්පහ	151
		කළුතර	17
එකතුව			**765**

- **මැටි ආශ්‍රිත හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන**

මැටි ආශ්‍රිත හස්ත කර්මාන්ත දේශීය හා විදේශීය වෙළඳපලට භාණ්ඩ සැපයීමට හැකිවන පරිදි හා ඒ ආශ්‍රිත ගම්මානවල සෘජු හා වක්‍ර රැකියා අවස්ථා පුළුල් කරමින් දියුණු ගම්මාන බවට පත් කිරීම යන අරමුණු ඇතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

මේ යටතේ තෝරා ගත් ගම්මානයන් හි කර්මාන්තකරුවන් සඳහා ව්‍යවසායකත්ව පුහුණුව, ආකල්පමය සංවර්ධනය, නිෂ්පාදන සඳහා නව මෝස්තර ප්‍රවර්ධන වැඩසටහන්, නව තාක්ෂණය සහිත යන්ත්‍ර, උපකරණ හා අනෙකුත් පහසුකම් ලබා දීමට කටයුතු කරන ලද අතර පොදු පහසුකම් මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම තුළින් ද පහසුකම් සැලසීමට කටයුතු කර ඇත.

2021 වසරේ දී වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කණුමලේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොල්වත්ත සහ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරගුල යන මැටි ගම්මාන සංවර්ධනය කර ප්‍රතිලාභීන් 94 කට පහසුකම් සැලසීමට මෙම ව්‍යාපෘතිය මඟින් කටයුතු කර ඇත.

- **සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ගම්මාන සංවර්ධන වැඩසටහන**

මෙම ව්‍යාපෘතිය තුළින් තෝරා ගත් හස්ත කර්මාන්ත ගම්මාන 05 ක් සඳහා පහසුකම් සැලසීමට 2021 වසර තුළදී කටයුතු කරන ලද අතර එමඟින් කර්මාන්තකරුවන් සඳහා ව්‍යවසායකත්ව පුහුණුව, ආකල්පමය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිෂ්පාදන සඳහා නව මෝස්තර ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නව තාක්ෂණය සහිත යන්ත්‍ර, උපකරණ හා අනෙකුත් පහසුකම් ලබා දීම හා පොදු පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු සිදු කරන ලද අතර මෙම ව්‍යාපෘතියේ ද අරමුණ වුයේ අදාළ ගම්මානයන් හි නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම, නව රැකියා අවස්ථා ජනනය කිරීම හා වෙළඳපල අවස්ථා පුළුල් කිරීමයි.

මෙම වැඩසටහන යටතේ 2021 වසරේ දී සංවර්ධනය කරන ලද ගම්මාන හා ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	ගම්මානයේ නම	ග්‍රාම සේවා වසම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	කර්මාන්ත ක්ෂේත්‍රය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
01	කළුකොදෙයාව	402 නැගෙනහිර/ බටහිර	දොම්පෙ	මැටි	11
02	ඇලප්පන්කුලම	581 මරදන්කල්ල	මිහින්තලය	මැටි	27
03	බෝධිවල	බෝධිවල	හගුරන්කෙත	කුළු	10
04	බඩල්කුඹුර	මඩුගහපට්ටිය/ඇත්තලාමුල්ල	බඩල්කුඹුර	මැටි	05
05	වේරගල	738බී - කටුකුරුඳුගහලන්ද නැගෙනහිර/ 738 ඒ - වේරගල	බෙරුවල	බට	10
එකතුව					**63**

- **ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදිතයන් අලෙවි කිරීම ජාත්‍යන්තර මට්ටම කරා ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය, ජාතික ශිල්ප සභාව සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ඒකාබද්ධව කටයුතු කිරීමට මෙම වසරේ දී පියවර ගෙන ඇති අතර ඊට අදාළව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කරන ලදී.

- **CINEC පෞද්ගලික විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධව ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ අභිවෘද්ධිය උදෙසා තාක්ෂණ පැවරීමේ ක්‍රමවේදයක් සැකසීම**

ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ අභිවෘද්ධිය උදෙසා ජාතික අමුද්‍රව්‍ය බැංකුව සඳහා හණ සැකසුම් යන්ත්‍ර (Machine for processing Agava), වේවැල් ඉවත් කිරීමේ යන්ත්‍ර (Machine for Removing Rattan) සහ වේවැල් සැකසුම් යන්ත්‍ර (Machine for processing Rattan) අළුතින් ලබා ගැනීම හා ජාතික ශිල්ප සභාව වෙත එම තාක්ෂණය පවරා දීම සම්බන්ධයෙන් CINEC පෞද්ගලික විශ්ව විද්‍යාලය, ජාතික ශිල්ප සභාව සහ රාජ්‍ය අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී. ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී වියදම් ඇස්තමේන්තුවට අනුව රු.1,770,000 ක ප්‍රතිපාදනයක් අමාත්‍යාංශය විසින් CINEC පෞද්ගලික විශ්ව විද්‍යාලයට සපයන ලදී.

- **වාණිජ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදිතයන් අලෙවි කිරීම ජාත්‍යන්තර මට්ටම කරා ප්‍රවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් සැකසීම**

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ ඒකාබද්ධව ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදනවල ගුණාත්මය ඉහළ නැංවීම සඳහා ක්‍රමවේදයක් සැකසීම.

විදේශ වෙළඳපල ඉල්ලුමට ගැලපෙන පරිදි ඉහළ ගුණාත්මයෙන් යුත් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී සුදුසු වර්ණක භාවිතා කරන ආකාරය, නිෂ්පාදන දෝෂ රහිත වීම, ජල කාන්දුවීම් සහ වෙනත් රසායනික ප්‍රතික්‍රියාවන් හේතුකොටගෙන ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදිතයන්හි පෘෂ්ඨයන් මතුපිට පුස් (Mold) බැඳීම, දිලීර ආසාදනයන් (Fungus Infection) සහ කෘමීන්ගෙන් වන හානි වැනි නිෂ්පාදිත භාණ්ඩවලට හානි පමුණුවන දෑ නිසා කර්මාන්තකරුවන් හට භාණ්ඩ නිෂ්පාදනයේදී සහ අලෙවියේදී මුහුණපෑමට සිදුවන නොයෙකුත් දුෂ්කරතාවයන්ට විසඳුම් ලබාගැනීම, පවතින ස්වාභාවික සම්පත් උපයෝගී කරගෙන නිෂ්පාදනයන් සිදු කිරීම යනාදිය සම්බන්ධයෙන් විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධව කටයුතු කිරීමට අදාළ මූලික සාකච්ඡා පවත්වා ඇත.

- **දේශීය හස්ත කර්මාන්ත හා නිර්මාණ විදේශයන් හි ප්‍රවර්ධනය කිරීම**

මෙරට සාම්ප්‍රදායික අත්කම් භාණ්ඩ විදේශයන්හි ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික වෙස් මුහුණු හා තෝරා ගත් සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත නිෂ්පාදන රුසියාවේ ජාතික කෞතුකාගාරය වෙත ලබාදෙන ලෙස සිදු කරන ලද ඉල්ලීමකට අනුව විදේශ කටයුතු අමාත්‍යාංශය හා ඒකාබද්ධව අදාළ කාර්යය මෙම අංශය විසින් සිදු කරන ලදී. තව ද මෙරට දේශීය හස්ත කර්මාන්ත නිෂ්පාදන විදේශ රටවල සංස්කෘතික ප්‍රදර්ශන, වෙළඳ ප්‍රදර්ශන, සංචාරක ප්‍රවර්ධන වැනි

අවස්ථාවල දී ප්‍රදර්ශනය කිරීමේ හා අලෙවි කිරීමේ කාර්යය තුළින් ශ්‍රී ලාංකේය අත්කම් විදේශයන් හි ප්‍රචලිත කිරීමට අමාත්‍යාංශය කටයුතු කර ඇත.

- **ග්‍රාමීය හා සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා දේශීය, විදේශීය අලෙවි ප්‍රවර්ධන අවස්ථා උදා කර දීම**

    - ගැටහැත්ත පැරණි දුම්රියපළ ගොඩනැගිල්ල අලෙවි මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම

රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ භාණ්ඩ අලෙවිය සඳහා නිශ්චිත අලෙවි මධ්‍යස්ථානයක් නොමැති වීම ප්‍රධාන ගැටළුව වී ඇති අතර දුම්රිය මාර්ගය භාවිතයෙන් අවසන් වූ පසු ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ලෙස භාවිතා කර පසුකාලීනව භාවිතයට නොගෙන අත්හැර දමා ඇති ගැටහැත්ත පැරණි දුම්රියපළ ගොඩනැගිල්ල, අලෙවි මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝග්‍ය ස්ථානයක් බව යෝජනා වී තිබිණි.

ඒ අනුව, ගැටහැත්ත පැරණි දුම්රියපළ ගොඩනැගිල්ල අලෙවි මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇති අතර මෙම ඉදි කිරීම වෙනුවෙන් රු.2,700,000 ක ප්‍රතිපාදන අමාත්‍යාංශය මඟින් සපයන ලදී.

මෙම අලෙවි මධ්‍යස්ථානය ‘‘සෞභාග්‍යා විශ්මකලා මැදුර’’ නමින් අමාත්‍යාංශය හා ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඒකාබද්ධව සංවර්ධනය කරන ලදී.





- නාරාහේන්පිට ‘‘රජවාස’’ පරිශ්‍රයේ අලෙවි කුටියක් ස්ථාපිත කිරීම

රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව සතු නාරාහේන්පිට ‘‘රජවාස’’ පරිශ්‍රය ග්‍රාමීය හා සාම්ප්‍රදායික නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා යොදා ගැනීම වෙනුවෙන් මෙම අමාත්‍යාංශය හා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව අතර අවබෝධතා ගිවිසුමක් 2021 වසරේ දී අත්සන් කරන ලදුව එම පරිශ්‍රය තුළ ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකිරීම සඳහා වෙළඳ කුටි ඉදි කිරීමට පියවර ගෙන ඇත. අමාත්‍යාංශය, ජාතික ශිල්ප සභාව හා ඒකාබද්ධව මෙම වෙළඳ කුටි ඉහත කී කර්මාන්තකරුවන්ගේ අලෙවි ප්‍රවර්ධනය සඳහා ලබා දීමට කටයුතු කරමින් පවතී.

- පොළොන්නරුව මුණියන්ඩි වැව ආශ්‍රිතව හෙළ කලා ගම්මානයක් ඉදි කිරීම සඳහා වූ ව්‍යාපෘතිය

පොළොන්නරුව මහා නගර සභාව විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව පොළොන්නරුව ගල් විහාරයට ආසන්නව පිහිටා ඇති මුණියන්ඩි වැව ආශ්‍රිතව හෙළ කලා ගම්මානයක් ඉදි කිරීම සඳහා මෙම අමාත්‍යාංශය කටයුතු කර ඇත. වෙළඳ කුටි 15 කින් සමන්විත මෙම ඉදිකිරීම ප්‍රදේශයේ ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තයන් හි නිරත වන කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිය සඳහා ලබා දීමට යෝජනා වී ඇති අතර ඒ තුළින් ප්‍රදේශයේ සංචාරක ආකර්ෂණය ලබා ගැනීමට හා කර්මාන්තකරුවන්ගේ ආදායම් උත්පාදනය සඳහා අවස්ථා උදා වීම සිදු වේ.

2.1.6 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල සියළුම මට්ටම් වෙතින් ඉටු කෙරෙන කාර්යයන් මැන බැලීම, සමාලෝචනය, ඇගයීම හා අභ්‍යන්තර පාලන ක්‍රමය සම්බන්ධයෙන් වාර්තා කිරීම මඟින් කළමනාකරණය සඳහා සහය වීම අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය වේ.

2021 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

- **අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම**

2021 වසරේ තුන්වන කාර්තුවේ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත වීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම පිළියෙළ කර අනුමත කර ගැනීම හා තුන්වන කාර්තුව සඳහා වන ඇගයීම් වාර්තාව ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

- **විගණන කාර්යන් සිදු කිරීම**

අමාත්‍යාංශයේ මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම්වල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා විගණන සිදු කිරීම හා කාර්යඵල විගණනය මෙම අංශය මගින් සිදු කරන ලදී.

- **විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම**

2021 වසර තුළ දී කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ රැස්වීම් පැවැත්වීම සීමා කිරීම හේතුවෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 01 ක් පමණක් සංවිධානය කරන ලදී. අමාත්‍යාංශය යටතේ පවතින ජාතික ශිල්ප සභාවේ ද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 01 ක් සඳහා අමාත්‍යාංශය නියෝජනය කරමින් සහභාගී වූ අතර විගණනය සඳහා එම ආයතනය මඟින් තොරතුරු ගෙන්වා ගැනීම ද සිදු කරන ලදී .

- **පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීම**

අමාත්‍යාංශ ලේකම් වෙත ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු මෙම අංශය විසින් සිදුකරන ලදී.

2.2 අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයන් හි කාර්යසාධනය

ජාතික ශිල්ප සභාව

1. හැඳින්වීම

හස්ත කර්මාන්ත සංරක්ෂණය සහ සංවර්ධනය මෙන්ම හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වයන් නංවාලීම ප්‍රධාන අරමුණ කොට 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධිත ආයතන පනත යටතේ ජාතික ශිල්ප සභාව ස්ථාපිත විය. පසුගිය දශක කිහිපය තුළ ජාතික ශිල්ප සභාව විසින් හස්ත කර්මාන්ත සංරක්ෂණය, සංවර්ධනය සහ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ සුභසාධනය වෙනුවෙන් විවිධ ව්‍යාපෘතීන් හා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත.

1.1. දැක්ම

"තිරසාර පැවැත්ම උදෙසා හෙළ අත්කම් පෝෂණය කිරීම හා සංරක්ෂණය කිරීම"

1.2. මෙහෙවර

"සාම්ප්‍රදායික සහ සංස්කෘතික වටිනාකමක් ඇති දේශීය හස්ත කර්මාන්ත සංරක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම, දිරි ගැන්වීම, ප්‍රවර්ධනය කිරීම සහ ශිල්පීන්ගේ ආර්ථික හා සමාජයීය තත්ත්වය නංවාලීම"

1.3. ප්‍රධාන ඉලක්කය

දළ දේශීය නිෂ්පාදිතයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් කරනු ලබන දායකත්වය වැඩිකර හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ජීවන මට්ටම ඉහළ නංවා ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැගීමට හැකි උපරිමයෙන් දායක වීම

1.4. අරමුණු/ ඉලක්ක

- දළ දේශීය නිෂ්පාදිතයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ දායකත්වය 50% කින් ඉහළ නංවා **"ආර්ථික වර්ධන වේගය 6.5% කින් ඉහළට"** යන සාර්ව ආර්ථික ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වීම

- හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ ඒක පුද්ගල ආදායම 50% කින් ඉහළ නංවා **"ඇ.ඩො. 6500 ඉක්මවා යන ඒක පුද්ගල ආදායමක්"** යන සාර්ව ආර්ථික ඉලක්කය සපුරාලීමට දායක වීම

- හස්ත කර්මාන්ත නිෂ්පාදන අපනයනය කිරීම තුළින් විදේශ විනිමය රු.මි. 2000 කින් ඉහළ නැංවීම හා ආනයන ආදේශක නිෂ්පාදන හඳුන්වා දීම තුළින් විදේශ විනිමය රු.මි. 5000 කින් ගලා යෑම අවම කිරීම තුළින් **"රුපියලේ අගය ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම"**ට දායක වීම

- හස්ත කර්මාන්ත ශිල්පීන් හා ආධුනිකයින් 7500 කට පුහුණුව ලබා දී, ස්වයං රැකියා 5000 ක් ජනිත කරමින් **"සේවා වියුක්ති අනුපාතය 4% ට අඩු අගයක්"** යන සාර්ව ආර්ථික ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වීම

- ජනතා කේන්ද්‍රීය ආර්ථිකයෙන් **"දේශීය ව්‍යවසායකයා ශක්තිමත් කිරීම"** යන මූලික අරමුණ සාක්ෂාත් කිරීම සඳහා හස්ත කර්මාන්තකරුවන් සඳහා මූල්‍ය, වෙළඳපොල, පුහුණුව, යටිතල පහසුකම් සහ අනෙකුත් පහසුකම් සැලසීම

- ප්‍රවීණ සහ පාරම්පරික හස්ත කර්මාන්ත ශිල්පීන් ඇගයීම, දිරිගැන්වීම, ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කරමින් **"ජාතික උරුමයන් මනා ලෙස සංරක්ෂණය කිරීම"**ට දායක වීම

1.5. කාර්යභාරය

- හස්ත කර්මාන්ත ශිල්පීන් හඳුනාගෙන ජාතික මට්ටමින් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම

- ශිල්පීන් සඳහා විරල අමුද්‍රව්‍ය සැපයීම හා එම කටයුතු සංවිධානය කිරීම

- හස්ත කර්මාන්ත ආශ්‍රිත ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා පහසුකම් සැලසීම

- හස්ත කර්මාන්ත නිෂ්පාදනවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- ගුරු ශිල්ප පුහුණු වැඩසටහන යටතේ පුහුණු පහසුකම් ලබා දීම

- ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන මඟින් පූර්ණ කාලීන හස්ත කර්මාන්ත පුහුණු පහසුකම් ලබා දීම හා නිෂ්පාදන පහසුකම් ලබා දීම

- දේශීය හා විදේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- පළාත් හා ජාතික මට්ටමින් ප්‍රදර්ශන සහ තරඟ පැවැත්වීම

- හස්ත කර්මාන්ත නිෂ්පාදන ආශ්‍රිත නව තාක්ෂණය හඳුන්වා දීම

- හස්ත කර්මාන්ත ශිල්පීන් හට පහසුකම් සැලසීම සඳහා ණය හා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- ශිල්පීන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ආර්ථික හා සමාජයීය තත්ත්වය නංවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- ඉහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී පළාත් සභා සහ ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය ආයතන සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම

2. 2021 වර්ෂයේ කාර්යසාධනය

2.1. ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වගා කිරීමේ වැඩසටහන

හස්ත කර්මාන්ත නිෂ්පාදන ආශ්‍රිතව භාවිතා කරනු ලබන දුර්ලභ අමුද්‍රව්‍ය සුලභ කිරීම සඳහා රජයේ භාවිතා නොකළ හා ඌණ උපයෝජිත ඉඩම් යොදා ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය හිඟය තුරන් කරමින් නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා දීම, අමුද්‍රව්‍ය ආනයනය අවම කිරීම තුළින් විදේශ විනිමය ඉතිරි කිරීම, දේශීය කර්මාන්තකරුවන්ට සාධාරණ මිලකට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීමට අවස්ථාව සැලසීම හා ග්‍රාමීය කර්මාන්ත ආශ්‍රිත භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය අවම කිරීම යන මූලික අරමුණු ඇතිව අක්කර 400ක් වගා කිරීමට මෙම වැඩසටහන මඟින් සැලසුම් කර තිබූ අතර මේ වන විට අක්කර 435.7ක් වගා කර ඇත.

- **හණ වගාව**

අනු අංකය	ස්ථානය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	අක්කර ප්‍රමාණය	වගා කළ පැළ ප්‍රමාණය
01	ඇහැටුවැව	ඇහැටුවැව	31	19,000
02	කල්තොට	කල්තොට	18	37,000
03	අනුරාධපුර ගිණිපටි මායිම	ප්‍රා.ලේ.කොට්ඨාස කිහිපයක් ආවරණය වේ	37	44,400
04	කන්දකැටිය ලොග්ගල්ඔය	කන්දකැටිය	09	6,200
05	පොළොන්නරුව මහවැලි B කලාපය	ප්‍රා.ලේ.කොට්ඨාස කිහිපයක් ආවරණය වේ	180	197,600
06	මහවැලි L කලාපය	ප්‍රා.ලේ.කොට්ඨාස කිහිපයක් ආවරණය වේ	90	90,000
07	බිබිල පේරණ	බිබිල	12	14,400
08	බදුල්ල වේවැල්හින්න	හාලිඇළ	04	2,000
09	මාතලේ යටවත්ත	යටවත්ත	01	1,200
10	කෑගල්ල බදුළුපිටිය	මාවනැල්ල	1/2	600
11	හඟුරන්කෙත ජොන්ස්ටන්වත්ත	හඟුරන්කෙත	01	1,200
එකතුව			**383.5**	**413,600**





රත්නපුරය - කල්තොට හණ වගා කිරීමේ වැඩසටහන





ඇහැටුවැව හණ වගා කිරීමේ වැඩසටහන






පොළොන්නරුව මහවැලි **B** කලාපය හණ වගා කිරීමේ වැඩසටහන





මහවැලි **L** කලාපය හණ වගා කිරීමේ වැඩසටහන

- **පන් වගාව**

අනු අංකය	ස්ථානය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	අක්කර ප්‍රමාණය	වගා කල පැළ ප්‍රමාණය
01	කළුතර පන්තොට	වලල්ලාවිට	8.5	158,800
02	ගාල්ල ඉදුරුව	බෙන්තොට	01	20,000
03	කළුතර මාවල	කළුතර	8.2	100,000
04	රත්නපුර ඇළපාත	ඇළපාත	01	5,000
05	මාවී ඇළ	පඬුවස්නුවර නැගෙනහිර	0.25	3,000
එකතුව			**18.95**	**286,800**






පන්තොට පන් වගා කිරීමේ වැඩසටහන






කළුතර - මාවල පන් වගා කිරීමේ වැඩසටහන

- වේවැල් වගාව

අනු අංකය	ස්ථානය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	අක්කර ප්‍රමාණය	වගා කල පැළ ප්‍රමාණය
01	යටියන්තොට පැලැල්ලේගම	යටියන්තොට	07	3000
02	වනාතවිල්ලුව රාල්මඩුව	වනාතවිල්ලුව	15	6000
03	අකුරැස්ස විල්පිට	අතුරලිය	05	2000
04	කළුතර හොරණ	ඉංගිරිය	02	800
එකතුව			**29**	**11,800**






වනාතවිල්ලුව රාල්මඩුව වේවැල් වගා කිරීමේ වැඩසටහන

- **වෙනත් වගාවන්**

අනු අංකය	ස්ථානය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	වගා කළ අමුද්‍රව්‍ය	අක්කර ප්‍රමාණය	වගා කල පැළ ප්‍රමාණය
01	හිරිගල්ගොඩැල්ල	බේරුවල	දුනුකෙයියා	01	400
02	පොළොන්නරුව මහවැලි B කලාපය	ප්‍රා.ලේ.කොට්ඨාස කිහිපයක් ආවරණය වේ	සුදුහඳුන්	180	1,000
03	පොළොන්නරුව මහවැලි B කලාපය	ප්‍රා.ලේ.කොට්ඨාස කිහිපයක් ආවරණය වේ	කළුවර	180	2,000
එකතුව				**361**	**3,400**

2.2. ජාතික අමුද්‍රව්‍ය කළමනාකරණ ඒකකය (බැංකුව) ස්ථාපිත කිරීම

වේවැල්, පිත්තල, මැටි සහ අනෙකුත් විශේෂිත සාම්ප්‍රදායික සහ ග්‍රාමීය කර්මාන්ත සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය ලබා ගැනීමට පහසුකම් සැලසීම් කරමින්, හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ප්‍රසාරණය කිරීම හා ග්‍රාමීය කර්මාන්ත නිෂ්පාදන අංශය සහ අමුද්‍රව්‍ය සැපයුම් ජාලය ශක්තිමත් කිරීම තුළින් සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ආශ්‍රිත රැකියා අවස්ථා සැලසීම් කිරීම යන මූලික අරමුණු ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

ජාතික ශිල්ප සභාව යටතේ පළාත් මට්ටමින් අමුද්‍රව්‍ය ගබඩා ස්ථාපිත කර කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඉතා සාධාරණ මිලට ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් මෙම ව්‍යාපෘතිය යටතේ සැලසෙනු ඇත.

- **අමුද්‍රව්‍ය ගබඩා ස්ථාපිත කිරීම සඳහා නවීකරණය කරන ලද ගබඩා සංකීර්ණ**

අනු අංකය	ස්ථානය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	දිස්ත්‍රික්කය	පළාත
01	වරාගොඩ සෙරමික් පුහුණු මධ්‍යස්ථානය	කැළණිය	ගම්පහ	බස්නාහිර
02	ඉදිපරපේ කෘතිම මල් පුහුණු මධ්‍යස්ථානය	මීරිගම	ගම්පහ	බස්නාහිර
03	වැලිය පුහුණු මධ්‍යස්ථානය	මිනුවන්ගොඩ	ගම්පහ	බස්නාහිර
04	බුලත්සිංහල වේවැල් පුහුණු මධ්‍යස්ථානය	බුලත්සිංහල	කළුතර	බස්නාහිර
05	මධ්‍යම පළාත් කාර්යාලය පොල්ගොල්ල	පොල්ගොල්ල	මහනුවර	මධ්‍යම
06	හබරාදුව අළෙවිසැල	හබරාදුව	ගාල්ල	දකුණ
07	උණබට පුහුණු මධ්‍යස්ථානය	කුරුවිට	රත්නපුරය	සබරගමුව
08	කාවන්තිස්සපුර හම්බන්තොට	තිස්සමහාරාමය	හම්බන්තොට	දකුණ
09	සේනාපති මොනරාගල	මැදගම	මොනරාගල	ඌව
10	පොළොන්නරුව - මනම්පිටිය	මනම්පිටිය	පොළොන්නරුව	උතුරු මැද





ගම්පහ - වරාගොඩ ගබඩා සංකීර්ණය




මහනුවර - පොල්ගොල්ල ගබඩා සංකීර්ණය

- **චක්‍රීය අරමුදලෙන් ශිල්පීන් වෙත ලබා දීමට මිලදී ගත් අමුද්‍රව්‍ය**

අනු අංකය	අමුද්‍රව්‍ය වර්ගය	ප්‍රමාණය	ලබා ගත් ආයතනය
01	වේවැල්	අඩි 11,850	-
02	උණ්ඩ කොපු - යකඩ	4556.2 kg	ගුවන් හමුදාව
03	පිත්තල, තඹ හිස් උණ්ඩ කොපු	2385 kg	නාවික හමුදාව
04	පිත්තල	42,164.12 kg	ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය
05	රිදී	9195 kg	ලංකා බැංකුවේ සී බෑන්ක් ගෝල්ඩ් ෂොප්
06	මැටි	25,000 kg	පිහන් සංස්ථාව

2.3. ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන

සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ගම්මාන දේශීය හා විදේශීය වෙළඳපලට භාණ්ඩ සැපයීමට හැකිවන පරිදි නිෂ්පාදන හා කර්මාන්ත ගම්මාන බවට පත් කරමින්, ඒ ආශ්‍රිත ගම්මානවල සෘජු හා වක්‍ර රැකියා අවස්ථා පුළුල් කරමින් දියුණු ගම්මාන බවට පත් කිරීම හා ආර්ථික, සමාජ සංවර්ධනය මෙන්ම දුගීබව අවම කිරීම, කාන්තාව ශක්තිමත් කිරීම, ප්‍රාදේශීය විෂමතා අවම කිරීම සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම තුළින් සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත, ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන කොටසක් බවට පත් කිරීම යන අරමුණු ඇතිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් 25ම ආවරණය වන පරිදි එක් දිස්ත්‍රික්කයකින් ගම්මාන 4 ක් වන සේ 2021 වසරේ දී සාම්ප්‍රදායික හා ග්‍රාමීය හස්ත කර්මාන්ත ගම්මාන 100 ක් සංවර්ධනය කර ප්‍රතිලාභීන් 3000කට වැඩි ප්‍රමාණයකට අවශ්‍ය පහසුකම් සැලසීම අරමුණු කරන ලදී .

මෙම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තෝරා ගත් ගම්මානයන් හි කර්මාන්තකරුවන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය, ආකල්පමය සංවර්ධනය, නිෂ්පාදන හා නව මෝස්තර ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නව තාක්ෂණය සහිත යන්ත්‍ර, උපකරණ හා අනෙකුත් පහසුකම් ලබා දීමට කටයුතු කරන ලද අතර පොදු පහසුකම් මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම තුළින් ද පහසුකම් සැලසීමට කටයුතු කරන ලදී.

ඒ අනුව, 2021 වර්ෂය තුළ ගම්මාන 98 ක් සංවර්ධනය කර ප්‍රතිලාභීන් 2738 කට පහසුකම් ලබා දී ඇත.

- **සංවර්ධනය කරන ලද ගම්මාන ලේඛනය**

අනු අංකය	ගම්මානයේ නම	ග්‍රාම සේවා වසම	ප්‍රා.ලේ. කොට්ඨාසය	සක්‍රිය කර්මාන්ත ක්ෂේත්‍රය	ශිල්පීන් සංඛ්‍යාව
පළාත - දකුණු පළාත					
දිස්ත්‍රික්කය - මාතර					
01	කුඹල්ගම	වල්ලිවල නැගෙනහිර, බටහිර, දකුණ, පිටිදූව (379 ඒ)	වැලිගම	මැටි	19
02	පැතුම්ගම	ඌරාපොල නැගෙනහිර	කඹුරුපිටිය	බට පතුරු	18
03	පුබුදු (රත්මලේ)	බඹරන්ද උතුර	දික්වැල්ල	මැටි	20
04	ගලබඩහේන, කියාඩුව	360/C, ගලබඩහේන කියාඩුව	අකුරැස්ස	බට පතුරු	28
දිස්ත්‍රික්කය- හම්බන්තොට					
05	ඉහළගොඩ හා පොතුවිලේගොඩ	බෙලිගල්ල දකුණ, උතුර	බෙලිඅත්ත	විවිධ, ලාක්ෂා, පිත්තල, තල්	25
06	කොහොම්පෝරුව	කොහොම්පෝරුව - 517	කටුවන	මැටි	94
07	විලමුල්ල	විහාරමහාදේවිපුර	තිස්සමහාරාමය	තල්කොළ	30
08	රන්න (බට /නැගෙ.)	රන්න - (බට /නැගෙ.)	තංගල්ල	මැටි	54
දිස්ත්‍රික්කය - ගාල්ල					
09	පිටිගල	කරව්ව, පිටිගල, කලුආරව්වගොඩ	නියාගම	පාෂාණ, කැටයම්, මූර්ති	23
10	මාගාල්ල	අංක 99	කඩවත්සතර	බීරළු රේන්ද	18
11	දලවැල්ල	132 ඒ, දලවැල්ල	හබරාදූව	වැටකේ	30
12	ගිංතොට	පියදිගම	කඩවත්සතර	පන්	17
පළාත - වයඹ පළාත					
දිස්ත්‍රික්කය-කුරුණෑගල					
13	ගලතරය	999 ගලතරය	අලව්ව	තලකොළ, වටාපත්	25
14	තිත්තවැල්ල	433/ තිත්තවැල්ල	ගනේවත්ත	මැටි	55
15	සොලේපුර/වීරපොකුණ	සොලේපුර/වීරපොකුණ	ගිරිබාව	විවිධ	25
16	දොරටියාගෙදර	1411 දොරටියාගෙදර	පඬුවස්නුවර/ බටහිර	වේවැල්	17

අනු අංකය	ග්‍රාම නිලධාරී වසමේ නම	ග්‍රාම සේවා වසමේ නම	ප්‍රා.ලේ. කොට්ඨාසය	භාග්‍ය කර්මාන්ත ක්ෂේත්‍රය	ප්‍රකිලාභී ශිල්පීන් සංඛ්‍යාව
පළාත - වයඹ පළාත					
දිස්ත්‍රික්කය -පුත්තලම					
17	රාල්මඩුව ගම්මානය	රාල්මඩුව	වනාතවිල්ලුව	වේවැල්	14
18	පුලිච්චිකුලම	593 පුලිච්චිකුලම	මුන්දලම	මැටි	19
19	රඹකනයාගම	644/1, රඹකනයාගම	නවගත්තේගම	පන්, තල්කොළ	22
පළාත- නැගෙනහිර					
දිස්ත්‍රික්කය-මඩකලපුව					
20	පොරෙයිතිව්	පට්ටපුරම්	වේල්ලාවෙලි	මැටි	30
21	වෙදර්කුඩිරුප්පු	මන්මුනෛපත්තු	මන්මුනෛපත්තු අරවාම්නාති	තල්	33
22	එරාඋර්පත්තු 4	එරාඋර්	චෙන්කලඩි	මැටි	40
23	ඔරුවිල්	ඔරුවිල්	මන්මුනෛ - දකුණ	පොල් කටු	40
දිස්ත්‍රික්කය- ත්‍රිකුණාමලය					
24	රාල්කුලි	මුත්තූර්-3	මුත්තූර්	මැටි	47
25	සිනාමුල්ලායිචේනි	වෙල්ලාමනල්	ත්‍රිකුණාමලය නගරය	සිප්පි කටු	25
26	සාලියපුර	මොල්ලිපොතාන	තබලගමුව	පන්	36
27	අඩම්බෝඩායි	වෙල්ලූර්	කුච්චවේලි	තල්	34
දිස්ත්‍රික්කය- අම්පාර					
28	පැනමා	පැනමා දකුණ	ලාහුගල	තල්	50
29	උහන	උහන	උහන	මැටි	38
30	හේනානිගල	හේනානිගල	දෙහිඅත්තකණ්ඩිය	පන්	17
පළාත - සබරගමුව					
දිස්ත්‍රික්කය- කෑගල්ල					
31	අල්කේගම	අංක 23, මා කෙහෙල්වල	මාවනැල්ල	හණ	30
32	පැලැල්ලේ ගම	115F පැලැල්ලේ ගම	යටියන්තොට	උණබට	30
33	කහඹිලියාගොඩ	6B, වහව	රඹුක්කන	මැටි	18
34	සාමගම	42 C, කීරපන	අරණායක	මැටි	12

අනු අංකය	ගම්මානයේ නම	ග්‍රාම සේවා වසම	ප්‍රා.ලේ. කොට්ඨාසය	හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය	ශිල්පීන් සංඛ්‍යාව
පළාත- සබරගමුව					
දිස්ත්‍රික්කය - රත්නපුරය					
35	කුරුවිට උණබට මධ්‍යස්ථානය	දෙල්ගමුව	කුරුවිට	උණබට	28
36	විකිළිය	252B, විකිළිය	බලංගොඩ	හණ කෙඳි	30
පළාත - ඌව					
දිස්ත්‍රික්කය- බදුල්ල					
37	දෙහිගොල්ල	දෙහිගොල්ල හා බෙලිගල්ල	මහියංගනය	රතු මැටි	23
38	ස්ප්‍රිංවැලි	ස්ප්‍රිංවැලි, 85බී	හාලිඇළ	බට ආශ්‍රිත නිෂ්පාදන	11
39	හාලි ඇළ හැතැක්ම	පට්ටිපොල, 75බී	හාලිඇළ	රතුමැටි	08
40	හල්දුම්මුල්ල	ඉහලකොස්ගම	හල්දුම්මුල්ල	සාම්ප්‍රදායික බලිතොවිල්	12
දිස්ත්‍රික්කය - මොනරාගල					
41	කොඩයාන, කොලොන්විත්න	කොලොන්විත්න	මොනරාගල	පන්	21
42	නාගල	නාගල	බිබිල	වේවැල්	32
43	සෙවනගල කොවුල්ආර	කටුපිලගම	සෙවනගල	සෙරමික්	05
44	පොල්ගහවෙල	පොල්ගහවෙල	මැදගම	රතුමැටි	13
45	ගෝතමීගම	කතරගම	කතරගම	විසිතුරු/ දෙබරඇට	19
46	කරවිලේගම	කතරගම	කතරගම	තල්කොළ	18
පළාත-මධ්‍යම					
දිස්ත්‍රික්කය- මහනුවර					
47	ඇම්බැක්ක	ඇම්බැක්ක, සියඹලාගොඩ	උඩුනුවර	දැව කැටයම් / මූර්ති	32
48	මහරවෙල/ දිඹියන්වත්ත	785 මහරවෙල	මැදදුම්බර	මැටි	31
49	මඩවල	640 මඩවල	පාතදුම්බර	පිත්තල කැටයම්	19
50	තලගුනේ	875/තලගුනේ	උඩුදුම්බර	දුම්බර රටා කපු	08
51	පිටවල	677 හුරිකඩුව බටහිර	කුණ්ඩසාලේ	මැටි	19

අනු අංකය	ගම්මානයේ නම	ග්‍රාම සේවා වසම	ප්‍රා.ලේ. කොට්ඨාසය	හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය	ප්‍රතිලාභී ශිල්පීන් සංඛ්‍යාව
පළාත-මධ්‍යම					
දිස්ත්‍රික්කය - මාතලේ					
52	රුසිරුගම	වැලිගම, උල්පතිපාටිය, කුරිවෙල, පරගහවෙල	උකුවෙල	පිත්තල කැටයම්	31
53	ආලෝකගම	ආලෝකගම	යටවත්ත	හණ	17
54	ලේනාවල, යටිවැහැර	ලේනාවල, යටිවැහැර	ගලේවෙල	මැටි ආශ්‍රිත	08
55	නිලංනොරුව	නිලංනොරුව	පල්ලෙපොල	පැදුරු	36
දිස්ත්‍රික්කය - නුවරඑළිය					
56	පුරාණගම	පුරාණගම	හඟුරන්කෙත	මැටි	14
57	ඇකිරිය / පල්ලේබෝවල	ඇකිරිය	හඟුරන්කෙත	හණ කෙඳි	26
පළාත - උතුරු මැද					
දිස්ත්‍රික්කය - අනුරාධපුරය					
58	කුණුරාගම	654 පොතාන	මිහින්තලය	පන්	31
59	කුරුළුගම	32 කුරුළුගම	කැබිතිගොල්ලෑව	මැටි	19
60	කුඩාකැලෑගම	545 ඉහල අඹතලේ	ගලෙන්බිදුනුවැව	මැටි	37
61	ලූල්නෑව	198	කහටගස්දිගිලිය	මැටි	37
දිස්ත්‍රික්කය - පොළොන්නරුව					
62	ඉහලවැව	243 ඉහල වැව, 239 අලුවාකුඹුර	දිඹුලාගල	මැටි	10
63	මාලකපුර	42 විජයරාජවැව	හිගුරක්ගොඩ	පන්-හම්බු	20
64	2ඇළ/ පලුගස්දමන	174 පලුගස්දමන	තමන්කඩුව	වේවැල්	25
65	අලුත්වැව	111 තලාකොළවැව	මැදිරිගිරිය	පන්	15
පළාත - බස්නාහිර					
දිස්ත්‍රික්කය - කොළඹ					
66	රනාල මැටි ගම්මානය	469, රනාල	කඩුවෙල	මැටි	30
67	නවගමුව දකුණ	470/A, නවගමුව, දකුණ	කඩුවෙල	වෙස්මුහුණු	13

අනු අංකය	ගම්මානයේ නම	ග්‍රාම සේවා වසම	ප්‍ර.ලේ. කොට්ඨාසය	ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍රය	ප්‍රතිලාභී ශිල්පීන් සංඛ්‍යාව
පළාත - බස්නාහිර					
දිස්ත්‍රික්කය - කළුතර					
68	දිවලකඩ	822B, දියවලකඩ, E-මීගහකුඹුර	බුලත්සිංහල	බට හා වේවැල්	50
69	කලපුගම	කලපුගම බටහිර	කළුතර	පන්	22
70	පන්තොට	783 A, දම්මන බටහිර	වලල්ලාවිට	ගල්ලැහැ පන් කර්මාන්තය	37
දිස්ත්‍රික්කය - ගම්පහ					
71	අලවල	364/A, අලවල දකුණ, 364,අලවලඋතුර, 364/ B ඇතාඋඩකන්ද	අත්තනගල්ල	බට	160
72	හුනුමුල්ල	හුනුමුල්ල	දිවුලපිටිය	මැටි	17
73	14 බෝතලේ පහලගම	14 බෝතලේ පහලගම	මීරිගම	මැටි	45
74	සමුර්ධිගම	119/6 සමුර්ධිගම	මිනුවන්ගොඩ	මැටි	21
75	වීරසේකරපුර	බියගම උතුර, බියගම දකුණ C	බියගම	මැටි	25
76	අක්කර 20 ගම්මානය	16 F හළුගම, 16 A හළුගම	මීරිගම	බටපතුරු, වේවැල්	45
77	රදාවඩුන්න	360 රදාවඩුන්න	මීරිගම	වේවැල්	81
පළාත-උතුර					
දිස්ත්‍රික්කය-වව්නියාව					
78	පරනද්දකල්	පරනද්දකල්	වව්නියාව	තල්	20
79	තුඩුවක්කායි	නෙරියකුලම්	වෙන්ගලා වෙඩ්ඩිකුලම්	තල්	21
80	පලයාරු	පූමඩුව - C209C	වව්නියාව දකුණ	පන්	16
81	ශ්‍රී රාමපුරම්	කතර්සින්නකුලම්- 215B	වව්නියාව	කඩදාසි අත්කම්/ බතික්	20
දිස්ත්‍රික්කය-යාපනය					
82	මඩුවිල්	මඩුවිල් දකුණ J/310	වාවකච්චේරි	මැටි	14
83	වඩඩුක්කෝඩ්ඩායි දකුණ	වඩඩු දකුණ J/165	වෙන්කනානි	දැව ආශ්‍රිත නිර්මාණ	65
84	මූර් විදිය	J/86, මූර් විදිය-දකුණ J/87, මූර් විදිය-උතුර	යාපනය	කොහු ආශ්‍රිත නිර්මාණ	13
85	කල්වියන්කාඩු	කලවියන්කාඩු J/113/109/90/257	නෙල්ලූර්	මැටි	11

අනු අංකය	ගම්මානයේ නම	ග්‍රාම සේවා වසම	ප්‍රා.ලේ. කොට්ඨාසය	භාවිත කර්මාන්ත ක්ෂේත්‍රය	ශිල්පීන් සංඛ්‍යාව
		පළාත-උතුර			
දිස්ත්‍රික්කය-මන්නාරම					
86	තලෙමන්නාරම උතුර	පුතුක්කාමම් MN48	මන්නාරම නගරය	තල්	25
87	සින්නාපුවරාසන්කුලම්	පොන්තිවුක්කන්ඩල් MNN121	නනාඩ්ඩන්	තල්	20
88	වෙඩ්ඩයාමුරුප්පු	වෙඩ්ඩයාමුරුප්පු	මන්තායි බටහිර	තල්	22
89	පෙසලායි දකුණ	පේසලායි MNN 56	මන්නාරම නගරය	බතික්	26
දිස්ත්‍රික්කය-කිලිනොච්චි					
90	කරච්චි	J/310,J/311,J/312,J/327	කරච්චි	මැටි	10
91	තාර්මමපුරම්	KN54, KN56, KN57	කන්ඩවලයි	මැටි	08
92	කිරන්චි	කිරන්චි KN 75	පූනගරි	තල්	42
93	කන්ඩවලයි/උරියන්	උරියන් KN49, කන්ඩවලයි KN51	කන්ඩවලයි	තල්	53
94	කොවිල්වයාල්	KN 78/ KN 79	පච්චිලාපල්ලි	තල්	22
දිස්ත්‍රික්කය- මුලතිව්					
95	තුනුක්කායි	MU16, MU17	තුනුක්කායි	පන්	30
96	කල්ලපාඩු දකුණ	MU110	මරිත්තෙයිපට්ටු	තල්	20
97	වලනියාර්මඩම්	මුල්ලිවයිකාල් බටහිර	මරිත්තෙයිපට්ටු	තල්	23
98	උදයර්කඩ්ඩු	උදයර්කඩ්ඩු උතුර Mu46, උදයර්කඩ්ඩු දකුණ Mu47	පුදුකුඩුඉරප්පු	තල්	23
		එකතුව			**2738**

- ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම





- ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ නිෂ්පාදන/ මෝස්තර ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

සංවර්ධනය කිරීමට පෙර නිෂ්පාදනයන්





හඳුන්වා දුන් නව නිෂ්පාදනයන්









මැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය













මාතලේ - නිලංනොරුව පන් ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය






කෑගල්ල - අල්කේගම හණ ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය

- ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ කර්මාන්තකරුවන් වෙත වැඩහල් පහසුකම් ලබා දීම




පුත්තලම - මුන්දලම, පුච්චාකුලම මැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය

- ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ පොදු පහසුකම් මධ්‍යස්ථාන අළුත්වැඩියාව




ගාල්ල - පියදිගම පන් ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය




මොණරාගල - නාගල වේවැල් ආශ්‍රිත නිෂ්පාදන ගම්මානය

- ගම්මාන සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කරන ලද ගම්මානවල ශිල්පීන් වෙත ප්‍රතිලාභ ලබා දීම







අලවල බට ආශ්‍රිත ගම්මානය




රදාවඩුන්න වේවැල් ආශ්‍රිත ගම්මානය

2.4. ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන

සාම්ප්‍රදායික සහ ග්‍රාමීය කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා ඇති ඉල්ලුම හා ශ්‍රී ලාංකේය නිෂ්පාදන සම්බන්ධව දේශීය හා විදේශීය පාරිභෝගිකයන් අතර දැනුවත්භාවය ඉහළ නංවමින්, විදේශීය තරහකාරී නිෂ්පාදන අභිබවා යන ඉහළම තලයේ දේශීය නිෂ්පාදන පාරිභෝගිකයා අතට පත් කර, නව නිෂ්පාදන, මෝස්තර සහ තාක්ෂණය සම්බන්ධ දැනුම හුවමාරු කර ගැනීම හා ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ ආදායම් ඉහළ නංවා ජීවන මට්ටම ඉහළට එසවීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂිතය.

මේ යටතේ ජාතික ශිල්ප සභාව මඟින් ක්‍රියාත්මක කරන හස්ත කර්මාන්ත නිෂ්පාදන අළෙවි මධ්‍යස්ථාන හා තෝරා ගත් සුපිරි වෙළඳසැල් හි විශේෂ අලෙවි කුටියක් ස්ථාපිත කර භාණ්ඩ අළෙවි කිරීමත්, දේශීය හා විදේශීය විශේෂිත දිනයන් හා උත්සව අවස්ථාවලදී අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, පළාත් මට්ටමින් මාසිකව හෝ ත්‍රෛමාසිකව අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් මේ යටතේ සැලසුම් කර ඇත.

ඒ අනුව, 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් පහත පරිදි වේ.

- බත්තරමුල්ල දියත උයන පරිශ්‍රයේ සතියේ බ්‍රහස්පතින්දා දිනයන් හි **"Shilpa Thursday"**අලෙවිපොළ වැඩසටහන් 22 ක් ක්‍රියාත්මක කර ඇත.
- පළාත් මට්ටමින් අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් 8 ක් පවත්වා ඇත. (ගාල්ල, වාරියපොළ, පල්ලෙකැලේ, සීගිරිය, මහනුවර, පොළොන්නරුව, කෑගල්ල හා ත්‍රිකුණාමලය)
- ජාතික ශිල්ප සභාව මඟින් ස්ථාපිත කර ඇති විශේෂිත අළෙවි මධ්‍යස්ථාන ලෙස කොළඹ - කොටුව ලන්දේසි රෝහල් පරිශ්‍රය, මොළගොඩ, ගාල්ල සිප්නාරා, වාරියපොළ යන "ලක් ශිල්ප" අළෙවි මධ්‍යස්ථාන සංවර්ධනය කර ඇත.
- විද්‍යුත් අලෙවිකරණය දිරිගැන්වීම සඳහා "www.lakshilpa.com" විද්‍යුත් අළෙවිකරණ වෙබ් අඩවිය 2021.11.22 දින දියත් කරන ලදී.




බත්තරමුල්ල දියත උයන පරිශ්‍රයේ Shilpa Thursday අළෙවිපොළ




මහනුවර KCC අළෙවිපොළ




විද්‍යුත් අලෙවිකරණ වෙබ් අඩවිය එළි දැක්වීම - බත්තරමුල්ල Water's Edge හෝටල් පරිශ්‍රය

2.5. හස්ත කර්මාන්ත ශිල්පීන් ලියාපදිංචිය හා හැඳුනුම්පත් නිකුත් කිරීම

හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ කාලීන තොරතුරු විස්තරාත්මකව ලබා ගෙන දත්ත පද්ධතියක් සකස් කර, එය යාවත්කාලීන කරමින් ඔවුන් සඳහා ජාතික ශිල්ප සභා ලියාපදිංචිය ලබා දී නව හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. එක් එක් ශිල්පීන්ගේ නිෂ්පාදන ධාරිතාවය, කුසලතාවයන්, ක්ෂේත්‍රයේ භාවිත අමුද්‍රව්‍ය හා අනෙකුත් අවශ්‍යතා ග්‍රාම නිලධාරී වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා දිස්ත්‍රික් මට්ටමින් හඳුනා ගෙන ඇති අතර අවශ්‍ය ඕනෑම අවස්ථාවක ලැබෙන දේශීය හා විදේශීය ඇණවුම් සඳහා මෙම තොරතුරු පද්ධතිය හරහා ශිල්පීන් වෙත අවස්ථාව ලබා දීමට හැකිවනු ඇත. 2021 වසර තුළ ශිල්පීන් 2512 ක් ලියාපදිංචිය සම්පූර්ණ කර ඇති අතර හැඳුනුම්පත් 1479 ක් නිකුත් කර ඇත.

- **2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා ශිල්පීන් ලියාපදිංචිය**

අනු අංකය	පළාත	දිස්ත්‍රික්කය	ලියාපදිංචි ශිල්පීන් සංඛ්‍යාව	මුළු ලියාපදිංචි ශිල්පීන් සංඛ්‍යාව
01	බස්නාහිර	කොළඹ	76	608
02		කළුතර	80	
03		ගම්පහ	452	
04	වයඹ	කුරුණෑගල	24	140
05		පුත්තලම	116	
06	සබරගමුව	කෑගල්ල	167	197
07		රත්නපුරය	30	
08	දකුණ	ගාල්ල	200	936
09		මාතර	220	
10		හම්බන්තොට	516	
11	මධ්‍යම	මහනුවර	152	262
12		මාතලේ	60	
13		නුවරඑළිය	50	
14	උතුරු මැද	අනුරාධපුරය	41	41
15		පොළොන්නරුව	-	
16	ඌව	බදුල්ල	70	129
17		මොනරාගල	59	
18	නැගෙනහිර	ත්‍රිකුණාමලය	75	75
19		අම්පාර	-	
20		මඩකලපුව	-	
21	උතුර	මන්නාරම	49	124
22		යාපනය	50	
23		මුලතිව්	-	
24		වව්නියාව	25	
25		කිලිනොච්චිය	-	
	එකතුව			**2512**

2.6. ශිල්ප සුභ සාධන වැඩසටහන

ජාතික ශිල්ප සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අතර ශිල්ප සුභසාධන වැඩසටහන ප්‍රධානම කාර්යයක් වන අතර එමඟින් ශිල්පීන් සඳහා මහඟු සේවාවක් ඉටු කරනු ලැබේ. මෙම වැඩසටහන යටතේ වයස්ගත ශිල්පීන්, ආබාධිත මට්ටමේ ශිල්පීන් සඳහා ආධාර මුදලක් ලබා දීම මෙන්ම ඒ ඒ අවස්ථා වලදී ශිල්පීන් විසින් කරනු ලබන ඉල්ලීම් සඳහා (සැත්කම්, හෘදයාබාධ, අක්ෂි රෝග හා විශේෂ සැත්කම් ආදී) ශිල්ප සුභ සාධන ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රතිචාර දැක්වීම සිදු කරනු ලබයි. මෙම වැඩසටහන යටතේ 2021 වසරේ දී ශිල්පීන් 58දෙනෙකු සඳහා පහසුකම් සලසා දී ඇත. තවද මෙම වැඩසටහන යටතේ තෝරාගත් ශිල්පීන් 19 දෙනෙකුට යාවජීව මාසික දීමනාව ලබා දී ඇත.

2.7. "ශිල්ප අභිමානී" ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත තරඟය හා ප්‍රදර්ශනය

පාරම්පරික හස්ත කර්මාන්ත ශිල්පීන් රැකගෙන, දිරිමත් කරමින් තම නිර්මාණ කුසලතා ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් ඇගයීමට ලක් කර ඒ සඳහා මූල්‍යමය දීමනා, කුසලතා හා සහතික පත්‍ර ලබා දී අනාගත පරපුර මෙම ක්ෂේත්‍රයට යොමු කිරීම යන අරමුණු පෙරදැරිව මෙම වැඩසටහන වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබයි.

"ශිල්ප අභිමානී - 2021" ජනාධිපති හස්ත කර්මාන්ත තරඟය සහ ප්‍රදර්ශනයට සමගාමීව පළාත් 09 ආවරණය වන පරිද්දෙන් පළාත් ප්‍රදර්ශන හා තරඟ 09 ක් ජාතික ශිල්ප සභාව, පළාත් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව සහ පළාත් සභා සමඟ එක්ව සංවිධානය කරනු ලැබූ අතර එහි දී ප්‍රථම, දෙවන හා තෙවන මට්ටමේ ජයග්‍රහණ හිමි කරගත් සියලු නිර්මාණ "ශිල්ප අභිමානී - 2021" ජාතික තරඟය හා ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කෙරිණි. එහි දී ජයග්‍රහණය කරන ලද ශිල්පීන් ජනාධිපති සම්මානයන්ගෙන් ඇගයීම සිදු කරන ලදී.

- **"ශිල්ප අභිමානී - 2021" ජාතික තරඟ ජයග්‍රහණ සාරාංශය**

අනු අංකය	පළාත	සම්මාන						
		ස්වර්ණ	රජත	ප්‍රථම	දෙවන	තෙවන	කුසලතා	එකතුව
01	මධ්‍යම	01	07	13	10	09	50	**90**
02	දකුණ	-	06	08	09	11	35	**69**
03	සබරගමුව	-	-	07	08	06	48	**69**
04	බස්නාහිර	01	02	09	08	09	36	**65**
05	ඌව	-	01	03	10	10	26	**50**
06	උතුරු මැද	-	01	08	05	05	24	**43**
07	වයඹ	-	01	02	03	04	21	**31**
08	උතුර	-	-	05	01	02	19	**27**
09	නැගෙනහිර	-	-	-	02	-	10	**12**
	එකතුව	**02**	**18**	**55**	**56**	**56**	**269**	**456**



සාම්ප්‍රදායික අංශය



නූතන අංශය

“ශිල්ප අභිමානී - 2021” ස්වර්ණ සම්මාන හිමි කර ගත් නිර්මාණ

2.8. ශිල්පීය පුහුණු ව්‍යාපෘතිය මඟින් පුහුණු වැඩසටහන්

ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 110 ක් දිස්ත්‍රික් 19 ක් ආවරණය වන පරිදි ස්ථාපිත කර ඇත. මෙම පුහුණු මධ්‍යස්ථානවලින් වාර්ෂිකව හා පූර්ණ කාලීන ලෙස පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර එය න්‍යායාත්මකව හා ප්‍රායෝගික යන අංශයන්ගෙන් සමන්විතය. තවද, ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන හරහා පුහුණුව ලැබූ ආධුනිකයින් සඳහා තම නිෂ්පාදන කටයුතු කරගෙන යාමට අවශ්‍ය පහසුකම් ද එම මධ්‍යස්ථාන තුළින්ම සැපයීම ද විශේෂත්වයකි. පුහුණු කාල සීමාව තුළ ආධුනිකයින් සඳහා මාසිකව දීමනාවක් ලබා දෙන අතර ප්‍රායෝගික පුහුණුව සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මධ්‍යස්ථාන වෙත ලබා දීම ද සිදු කරනු ලබයි. මෙම වසරේ දී එම මධ්‍යස්ථාන හරහා පූර්ණකාලීනව පුහුණුව ලැබූ ආධුනිකයින් සංඛ්‍යාව 385ක් වන අතර ශිල්පීන් 295 දෙනෙකු සඳහා නිෂ්පාදන පහසුකම් ලබා දීමද සිදු කර ඇත.

දිස්ත්‍රික් මට්ටමින් පවතින පුහුණු මධ්‍යස්ථාන, ක්‍රියාත්මක වූ මධ්‍යස්ථාන සංඛ්‍යාව, පූර්ණ කාලීනව පුහුණුව ලැබූ ආධුනික සංඛ්‍යාව හා නිෂ්පාදන පහසුකම් ලබා දී ඇති ශිල්පීන් සංඛ්‍යාව පහත වගුව තුළින් පැහැදිලි කර ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	මුළු මධ්‍යස්ථාන සංඛ්‍යාව	ක්‍රියාත්මක වූ මධ්‍යස්ථාන සංඛ්‍යාව	පූර්ණ කාලීනව පුහුණුව ලැබූ ආධුනික සංඛ්‍යාව	නිෂ්පාදන පහසුකම් ලබා දී ඇති ශිල්පීන් සංඛ්‍යාව
01	ගාල්ල	9	4	30	11
02	මාතර	5	4	27	02
03	හම්බන්තොට	6	3	23	12
04	මහනුවර	12	12	33	28
05	නුවරඑළිය	4	4	19	18
06	මාතලේ	2	2	13	10
07	කොළඹ	3	3	28	-
08	ගම්පහ	11	11	06	23

අනු අංකය	දිස්ත්‍රික්කය	මුළු මධ්‍යස්ථාන සංඛ්‍යාව	ක්‍රියාත්මක වූ මධ්‍යස්ථාන සංඛ්‍යාව	පූර්ණ කාලීනව පුහුණුව ලැබූ ආධුනික සංඛ්‍යාව	නිෂ්පාදන පහසුකම් ලබා දී ඇති ශිල්පීන් සංඛ්‍යාව
09	කළුතර	10	4	19	16
10	කුරුණෑගල	18	18	31	119
11	අනුරාධපුරය	2	2	27	05
12	පොළොන්නරුව	3	3	35	16
13	මොනරාගල	1	1	10	05
14	කෑගල්ල	6	5	45	13
15	රත්නපුර	3	3	39	17
16	මඩකලපුව	9	-	-	-
17	ත්‍රිකුණාමලය	4	-	-	-
18	යාපනය	1	-	-	-
19	අම්පාර	1	-	-	-
එකතුව		**110**	**79**	**385**	**295**

2.9. ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම

ජාතික ශිල්ප සභාව යටතේ ක්‍රියාත්මක ශිල්පීය පුහුණු මධ්‍යස්ථාන 110 ක් පමණ තිබෙන අතර මෙම මධ්‍යස්ථාන බොහොමයක් භාවිතයට ගත නොහැකි යල්පැනගිය ගොඩනැගිලිවලින් සමන්විත වේ. එබැවින්, අවම පහසුකම්වලින් සමන්විත වන පරිදි මෙම මධ්‍යස්ථාන සංවර්ධනය කර නව පරම්පරාව හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය කෙරෙහි ආකර්ෂණය කර ගැනීම මෙමඟින් අපේක්ෂා කෙරේ. ඒ අනුව, මෙම වසරේ පොළොන්නරුව - කදුරුවෙල, කැස්බෑව - කිදෙල්පිටිය හා බත්තරමුල්ල පුහුණු මධ්‍යස්ථානයන් හි සංවර්ධන කටයුතු සිදු කිරීමට කටයුතු කර ඇත.





බත්තරමුල්ල පුහුණු මධ්‍යස්ථානය

2.10. මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

ආයතනයක් සතු වටිනාම සම්පත වන මානව සම්පත සංවර්ධනය කිරීම කාලීන අවශ්‍යතාවක් වන අතර ඒ තුළින් සේවක තෘප්තිය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට හැකි වේ. මෙම ආයතනයේ කාර්ය මණ්ඩලය සතු කුසලතා සහ දැනුම වර්ධනය කිරීමට අවශ්‍ය මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කර ඇත. මෙහි දී මූලිකවම ඉංග්‍රීසි භාෂා, පරිගණක දැනුම, ව්‍යාපෘති කළමණාකරණය යන අංශ කෙරෙහි අවධානය යොමු කෙරිණි.

ඒ අනුව, මෙම වැඩසටහන යටතේ 2021 වසරේදී පුහුණුව ලබා දුන් සේවක සංඛ්‍යාව 40 කි.

පරිච්ඡේදය - 03

2021 වසර සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3.1 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය ACA-F

අයවැය 2021		සටහන	තත්‍ය (රු.)		
			2021	2020	
-	**ආදායම් ලැබීම්**		-		
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**ඒසිඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,006,512,000	204,523,483	**ඒසිඒ-3**
-	තැන්පතු		640,663	449,885	**ඒසිඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		16,284,303	51,254,230	**ඒසිඒ-5**
-	වෙනත් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,023,436,966**	**256,227,598**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,023,436,966**	**256,227,598**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**1,023,436,966**	**256,227,598**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
609,000,000	**වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ**	**5**	524,387,041	440,452,233	
270,170,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	210,671,392	48,069,660	
171,800,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	164,362,137	154,094,246	**ඒසිඒ-2(ii)**
-	පොළී ගෙවීම්	**8**	-	-	
100,000	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
1,051,070,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**899,420,570**	**642,616,139**	

අයවැය 2021		සටහන	තත්‍ය (රු.)		
			2021	2020	
	මූලධන වියදම්				
9,670,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	6,401,590		
8,600,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	8,477,289	2,513,544	
51,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	37,450,000	3,137,132	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	56,360,125	
4,500,000	හැකියා වර්ධනය	**14**	3,097,839	-	
2,115,000,000	වෙනත් මූලධන වියදම්	**15**	1,258,240,044	20,017,934	
2,188,770,000	**මුළු මූලධන වියදම් (උ)**		**1,313,666,762**	**82,028,735**	
	තැන්පතු ගෙවීම්		640,663	449,885	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		13,467,939	70,169,575	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**14,108,602**	**70,619,460**	
3,239,840,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		**2,227,195,934**	**795,264,334**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(1,203,758,968)**	**(539,036,736)**	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		-	-	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ඒසිඒ-3**
			(1,203,758,968)	**(539,036,736)**	

3.2 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ACA-P

	සටහන	තක්‍ෂ (රු.)	
		2021	**2020**
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	361,618,377	337,832,233
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	56,113,262	58,929,626
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**417,731,640**	**396,761,859**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		40,714,423	43,530,786
දේපළ පිරියත හා උපකරණ සංචිතය		361,618,377	337,832,233
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	15,398,840	15,398,840
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**417,731,640**	**396,761,859**

පිටු අංක **01**.සිට **61** දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක **62** සිට **85** දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

නම :

තනතුර :

දිනය :

General Daya Ratnayake.
Secretary
Ministry of Industries
73/1, Galle Road, Colombo 03.

.....

ගණන්දීමේ නිලධාරි

නම :

තනතුර :

දිනය :

M. A. B. V. Bandaranayake
Secretary
State Ministry of Rattan, Brass, Pottery, Furniture and Rural Industrial Promotion
Level 07, West Tower,
World Trade Centre
Colombo 01.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/

අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)

නම :

දිනය : 2022.02.22

කේ. කේ. ඩී. සී. ඉෂාර
ප්‍රධාන ගණකාධිකාරි
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
07 වන මහල, බටහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 01.

3.3 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ACA-C

	තත්‍ය (රු.)	
	2021	**2020**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	24,165,415	7,027,994
අග්‍රිම ලැබීම්	1,006,512,000	204,523,483
අත්තිකාරම් අයකර ගැනීම්	16,572,889	72,301,579
තැන්පතු ලැබීම්	640,663	449,885
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,047,890,967**	**284,302,941**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	683,485,888	117,662,216
සහනාධාර සහ මාරුකිරීම්	5,117,937	1,192,548
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	3,437,660	93,004,014
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	
අත්තිකාරම් ගෙවීම්	13,467,939	70,175,825
තැන්පතු ගෙවීම්	640,663	449,885
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**706,150,088**	**282,484,488**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**341,740,879**	**1,818,453**

	තත්‍ය (රු.)	
	2021	**2020**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	341,740,879	1,818,453
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**341,740,879**	**1,818,453**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ)-(ඉ)	**(341,740,879)**	**(1,818,453)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-

	තත්‍ය (රු.)	
	2021	**2020**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ) = (උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

3.4.1 වාර්තා කිරීමේ පදනම

- **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

- **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

- **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

- **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

- **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

- **මුදල් හා මුදල් සමාන දෑ**

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- **මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම**

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ප්‍රතිපාදනය	මුල් ප්‍රතිපාදනය	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %ලෙස
නැත					

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදනය,අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ %
	මුල් ප්‍රතිපාදනය (රු.)	අවසාන ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	1,051,070,000	1,051,070,000	899,420,570	86%
ප්‍රාග්ධන	2,188,770,000	2,188,770,000	1,313,666,762	60%

3.7 මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	අවසාන ප්‍රතිපාදනවල %
			මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදන (රු.)		
01	284 වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	පෝසිලේන්/සෙරමික් බුල්නෝස් ස්ට්‍රෙයින් ඉන්සියුලේටර් හා පෝසිලේන් / සෙරමික් රීල් ඉන්සියුලේටර් මිලදී ගැනීම සඳහා පුතිපාදන ලබාදීම	35,987,650.00	35,987,650.00	3,437,660.00	10%

3.8. සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව - මධ්‍යම රජය-2021 ACA - 6

ඉඩම	- 9153 :	වගුව	: SA 82
ගොඩනැගිල්ල	- 9151 :	වසර	: 2021
යන්ත්‍ර	- 9152 : 361618377.49	වාර්තා කරන දිනය	: 3/7/20229:34:30AM
සිදුකෙරෙන කාර්යයන්	- 9160 :	ශීර්ෂය	: 408
අස්පෘශ්‍ය	- 9154 :		
කල්බදු	- 9180 :		

ලෙජරය	කාණ්ඩය	අයිතමය	කේතය	ආරම්භක ශේෂය	ආරම්භක ශේෂයට එකතුකිරීම්	මාරු කිරීම්	මිළදී ගැනීම්	අපහරණය	ශේෂය
9152-->	**2.1 - ප්‍රවාහන උපකරණ**		**61121**	**220,464,062.20**	**5,247,519.75**	**-**	**-**	**-**	**225,711,581.95**
		මගී වාහන	****6112101	220,198,262.20	-	-	-	-	220,198,262.20
		මෝටර් සයිකල්	***6112109	265,800.00	5,247,519.75	-	-	-	5,513,319.75
9152-->	**2.2 - වෙනත් යන්ත්‍ර හා උපකරණ**		**61122**	**37,273,561.34**	**98,633,234.20**	**-**	**-**	**-**	**135,906,795.54**
		කාර්යාල උපකරණ	****6112201	6,538,494.17	3,204,611.00	-	-	-	9,743,105.17
		පරිගණක උපකරණ	****6112202	10,240,921.90	57,958,224.25	-	-	-	68,199,146.15
		විද්‍යුත් උපකරණ	****6112203	836,981.29	465,073.00	-	-	-	1,302,054.29
		සන්නිවේදන උපකරණ	****6112204	496,796.00	5,014,479.95	-	-	-	5,511,275.95
		ගෘහ උපකරණ	****6112205	19,160,367.98	19,678,401.00	-	-	-	38,838,768.98
		කර්මාන්ත හා නිෂ්පාදන උපකරණ	****6112212	-	12,312,445.00	-	-	-	12,312,445.00

සටහන් :-

මෙය පරිගණකය මගින් උත්පාදනය වූ ලේඛනයක් වන අතර අත්සන් අවශ්‍ය නොවේ.

CIGAS වෙබ් යෙදවුම මගින් උත්පාදනය වූ වාර්තාවකි - එස්. තර්ෂන් - අධ්‍යක්ෂ, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, විසින් සකස් කරනු ලැබීය.

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊඒසී/ඒ/එස්එම්ආර්අයිපී/එෆ්එස්/21/2 මබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 ජූනි 08දින

ලේකම්,

කර්මාන්ත අමාත්‍යාංශය

වේවැල්, පිත්තල, මැටි, ලිබඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

වේවැල්, පිත්තල, මැටි, ලිබඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වේවැල්, පිත්තල, මැටි, ලිබඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වේවැල්, පිත්තල, මැටි, ලිබඩු සහ ග්‍රාමීය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනු ලබන විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්
  කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සංසන්දනාත්මක අගයන් යටතේ දක්වා තිබූ අත්තිකාරම් බී ගිණුම යටතේ වන ලැබීම් හා ගෙවීම් ශේෂ ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 වර්ෂයේ 2 වන වැඩසටහන වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කිරීම් ලෙස රු.මිලියන 2,000 ක් ලබාගෙන තිබුණද එය මූල්‍ය ප්‍රකාශනයේ ACA 2, 2(i) හා 2(iii) ආකෘතියේ පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන යටතේ නොදක්වා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන යටතේ වූ රු.මිලියන 172 ක්ද සමඟින් රු.බිලියන 2.172 ක් ලෙස වාර්තා කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයන් 04 ක් සඳහා මු.රෙ. 66 යටතේ රු.19,450,000 ක ප්‍රතිපාදන මාරුකර ගෙන තිබූණි. ඒ අනුව ප්‍රතිපාදන මාරුකිරීම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 110 සිට 213 දක්වා පරාසයක වූ බැවින් වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අවශ්‍යතා නිසි ලෙස හඳුනාගෙන කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

ණය මුදල ගෙවා අවසන් වීමට පෙර විශ්‍රාම ගොස් සිටින නිලධාරීන් 03 දෙනෙකුගෙන්, මියගිය නිලධාරීන් 04 කුගෙන් සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 04දෙනෙකුගෙන් අයවිය යුතු රු.655,706 ක ණය ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව කටයුතු කර අයකරගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් ග්‍රාම නිලධාරී වසමකට එක් ග්‍රාමීය කර්මාන්ත ව්‍යවසායකයෙක් බිහිකිරීම සඳහා වූ විශේෂ ව්‍යාපෘති යටතේ රු.මිලියන 800 ක් වෙන්කර තිබූ අතර ඉන් ව්‍යවසායකයින් 14,016 ක් බිහිකිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද 2021 දෙසැම්බර් 31 දිනට වූ ප්‍රගතිය අනුව ව්‍යවසායකයින් 12,388 ක් තෝරාගෙන ඒ සඳහා රු.මිලියන 649.33 ක ප්‍රතිපාදන වැය කර තිබූ අතර එම තෝරාගත් ප්‍රතිලාභීන්ට ප්‍රාදේශීය සංවර්ධන කමිටු අනුමැතිය ලැබීම සියයට 47ක මට්ටමේ පැවතුණෙන්, වර්ෂය තුළ අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ග්‍රාමීය කර්මාන්ත නිෂ්පාදනවල අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කළ රු.මිලියන 30 කින් වෙළඳ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට වෙන් කළ මුදල රු.මිලියන 9කින් වැඩිකරගැනීමට අනුව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම්ද සංශෝධනය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත්කර ගැනීම් රු.23,786,145 ක් වුවද මූල්‍ය නොවන වත්කම් වාර්තාවෙහි වර්ෂය තුළ මිලදී ගැනීම් යටතේ දක්වනු වෙනුවට ආරම්භක ශේෂයට ගලපා තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරුවලින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 03 දෙනෙකු, ද්විතියික මට්ටමේ නිලධාරීන් 03 දෙනෙකු සහ ප්‍රාථමික මට්ටමේ එක් නිලධාරියකුගේ පුරප්පාඩු පැවති අතර අවශ්‍යතාව හඳුනාගෙන එම තනතුරු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

බී.ජී.අයි. නිරංජා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පරිච්ඡේදය - 04

කාර්යසාධන දර්ශක

ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	කාර්ය ඵලය	කාර්යසාධක දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
			100% - 90%	75% - 89%	50% - 74%
1	ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සුලභ කිරීම	• අදාළ වර්ෂය තුළ අමුද්‍රව්‍ය වගා කරන ලද භූමි ප්‍රමාණය	✓		
		• අදාළ වර්ෂය තුළ ස්ථාපිත කරන ලද අමුද්‍රව්‍ය බැංකු (ගබඩා) සංඛ්‍යාව			
		• අදාළ වර්ෂය තුළ බෙදාහරින ලද අමුද්‍රව්‍ය ප්‍රමාණය			
2	ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රය තුළ නව කර්මාන්තකරුවන් බිහිකිරීම	• අදාළ වර්ෂය තුළ බිහි කරන ලද නව කර්මාන්තකරුවන් සංඛ්‍යාව		✓	
	ක්ෂේත්‍රය තුළ දැනටමත් නිරත කර්මාන්තකරුවන් තවදුරටත් ඉහළට ඔසවා තැබීම	• අදාළ වර්ෂය තුළ තාක්ෂණික හා නිෂ්පාදන ගුණාත්මක භාවයෙන් වැඩිදියුණු කරන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව			
3	ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රය තුළ කර්මාන්තකරුවන් බලගැන්වීම	• ප්‍රතිලාභ ලබන ශිල්පීන් සංඛ්‍යාව	✓		
	ක්ෂේත්‍රය තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	• අදාළ වර්ෂය තුළ වැඩිදියුණු කරන ලද ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන සංඛ්‍යාව			
4	ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු කර්මාන්තකරුවන් සඳහා අලෙවි පහසුකම් ළඟාකර දීම	• අදාළ වර්ෂය තුළ උදාකර දෙන ලද වෙළඳපල අවස්ථා සංඛ්‍යාව		✓	
		– විද්‍යුත් අලෙවි අවස්ථා සංඛ්‍යාව			
		– ස්ථාපිත කරන ලද අලෙවි කුටි සංඛ්‍යාව			
		– විශේෂ අලෙවි අවස්ථා සංඛ්‍යාව			
		• අදාළ වර්ෂය තුළ වෙළඳපල අවස්ථා උදා කර දුන් කර්මාන්තකරුවන් සංඛ්‍යාව			

අනු අංකය	කාර්ය ඵලය	කාර්යසාධක දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
			100% - 90%	**75% - 89%**	**50% - 74%**
5	දැව ආශ්‍රිත නිෂ්පාදන සඳහා නව මෝස්තර හා ක්‍රියාවලි නව්‍යකරණය	• නව තාක්ෂණ පහසුකම් ලබා දුන් කර්මාන්තකරුවන් සංඛ්‍යාව	✓		
6	ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ තාක්ෂණික ගැටළු නිරාකරණය කිරීම	• පවත්වන ලද තාක්ෂණික සායනික සත්කාර වැඩසටහන් සංඛ්‍යාව • ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා තාක්ෂණික ආයතන වෙත යොමු කරන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව	✓		

පරිච්ඡේදය - 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. ආයතනයට අදාළ හඳුනාගත් තිරසර සංවර්ධන අභිමථාර්ත

- **වේවැල්, පිත්තල, මැටි, ලීබඩු හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

අනු අංකය	අභිමතාර්ථ/ අරමුණු	ඉලක්ක	ළඟා කර ගැනීමේ දර්ශක	ප්‍රගතිය		
				%49 - %0	%74-%50	%100-%75
01	SDG0 1 සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රයේ නව රැකියා අවස්ථා බිහිකිරීම	බිහි කරන ලද නව රැකියා අවස්ථා සංඛ්‍යාව			
		ග්‍රාමීය සහ සාම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රයේ පුහුණු අවස්ථා වැඩිකිරීම	පුහුණු ලාභීන් සංඛ්‍යාව පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව පුහුණුව ලත් කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන වැඩිදියුණු වීම (ගුණාත්මය සහ නිෂ්පාදන ප්‍රමාණ වැඩිවීම)			
		තාක්ෂණ සහය ලබා දීම	තාක්ෂණ සහය, යන්ත්‍රසූත්‍ර හා උපකරණ පහසුකම් ලබාදුන් කර්මාන්තකරුවන් සංඛ්‍යාව			✓
		කර්මාන්තකරුවන් සඳහා අමුද්‍රව්‍ය සුලබ කිරීම	අමුද්‍රව්‍ය ශාක වගා කරන ලද භූමි ප්‍රමාණය බිහි කරන ලද අමුද්‍රව්‍ය බැංකු/ ගබඩා සංඛ්‍යාව			
		ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා අළෙවි ප්‍රවර්ධන අවස්ථා ඇති කිරීම	ක්‍රියාත්මක කරන ලද අළෙවි ප්‍රවර්ධන අවස්ථා සංඛ්‍යාව (අළෙවිපොළ අවස්ථා, ලක් ශිල්ප අළෙවිසැල්, ලක් ශිල්ප වෙබ් අඩවිය අළෙවි පහසුකම් සලසන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව			

අනු අංකය	අභිමතාර්ථ/ අරමුණු	ඉලක්ක	ළඟා කර ගැනීමේ දර්ශක	ප්‍රගතිය		
				%49 - %0	%74-%50	%100-%75
02	SDG0 8 සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	ග්‍රාමීය සහ සම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රයේ නව රැකියා අවස්ථා බිහිකිරීම	බිහි කරන ලද නව රැකියා අවස්ථා සංඛ්‍යාව			
		ග්‍රාමීය සහ සාම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රයේ පුහුණු සහ ප්‍රමිතිකරණ අවස්ථා වැඩිකිරීම	පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව පුහුණුලාභීන් සංඛ්‍යාව ප්‍රමිති සහතික හා තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබා දුන් කර්මාන්තකරුවන් සංඛ්‍යාව			✓
		ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා අළෙවි ප්‍රවර්ධන අවස්ථා ඇති කිරීම	ක්‍රියාත්මක කරන ලද අළෙවි ප්‍රවර්ධන අවස්ථා සංඛ්‍යාව (අළෙවිපොළ අවස්ථා, ලක් ශිල්ප අළෙවිසැල්, ලක් ශිල්ප වෙබ් අඩවිය) අළෙවි පහසුකම් සලසන ලද කර්මාන්තකරුවන් සංඛ්‍යාව			
		තාක්ෂණ සහය ලබා දීම	තාක්ෂණ සහය, යන්ත්‍රසූත්‍ර හා උපකරණ පහසුකම් ලබාදුන් කර්මාන්තකරුවන් සංඛ්‍යාව			

අනු අංකය	අභිමතාර්ථ/ අරමුණු	ඉලක්ක	ළඟා කර ගැනීමේ දර්ශක	ප්‍රගතිය		
				%49 - %0	%74-%50	%100-%75
03	SDG 09 සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම	ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන වැඩිදියුණු කිරීම	වැඩිදියුණු කරන ලද කර්මාන්ත ගම්මාන සංඛ්‍යාව සංවර්ධනය කරන ලද පොදු පහසුකම් මධ්‍යස්ථාන සංඛ්‍යාව ප්‍රතිලාභීන් සංඛ්‍යාව			✓
		ග්‍රාමීය සහ සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නව තාක්ෂණ, පුහුණු, යන්ත්‍රසූත්‍ර ආදී පහසුකම් ලබා දීම	නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නව තාක්ෂණ, පුහුණු, යන්ත්‍රසූත්‍ර පහසුකම් ලබා ගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව			

5.2. තිරසර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීමේ අභියෝග

- **කොවිඩ් 19 වසංගත තත්ත්වයට මුහුණ දීමට සිදු වීම**

2021 වර්ෂය තුළ පැවති කොවිඩ් -19 ගෝලීය වසංගත තත්ත්වය තුළ අමාත්‍යාංශය සැලසුම් කර තිබූ ඇතැම් සංවර්ධන කාර්යයන්හි අපේක්ෂිත ඉලක්ක අත්කරගත නොහැකි විය.

විශේෂයෙන් දැව නිෂ්පාදන ආශ්‍රිත නිර්මාණ හා මෝස්තර මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම, ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන ආදී සංවර්ධන වැඩසටහන් සැලසුම් කළ පරිදි මෙම කාල පරිච්ඡේදය තුළ ඉටුකරගැනීමට නොහැකි වීම 2021 වර්ෂයේ අමාත්‍යාංශය මුහුණ දුන් ප්‍රධාන අභියෝග වේ.

තවද, කොවිඩ් -19 තත්ත්වය හමුවේ රට මුහුණ දුන් ආර්ථික දුෂ්කරතා හේතුවෙන් වෙළඳපොළ තුළ කර්මාන්තයන්ට අවශ්‍යවන යන්ත්‍ර සහ උපකරණ හිඟතාවය හා නිරන්තර මිල උච්ඡාවචනයට ලක්වීම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑමට සිදුවූ තවත් අභියෝගයන් වේ.

- **විවිධ රාජ්‍ය ආයතන මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් අතිච්ඡාදනය වීම (Overlap)**

ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රය ඉලක්ක කරගනිමින් මෙම අමාත්‍යාංශයට අමතරව වෙනත් රාජ්‍ය ආයතන ද සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් සඳහා තෝරාගත් ප්‍රතිලාභීන්/ ප්‍රතිලාභී ගම්මාන වෙනත් ආයතනයන් මඟින් ද සංවර්ධන වැඩසටහන් සඳහා තෝරාගැනීම හේතුවෙන් ප්‍රතිලාභී ලේඛණ නිරන්තරයෙන් සංශෝධනය කිරීමට සිදුවීම ද මෙම සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑමට සිදු වූ දුෂ්කරතාවයකි.

- **කර්මාන්තකරුවන් සඳහා පුහුණු ලබා දෙන රාජ්‍ය ආයතන අගනුවර කේන්ද්‍ර කොට ස්ථාපිතව තිබීම**

ග්‍රාමීය කර්මාන්ත නිෂ්පාදන සිදුකරන කර්මාන්තකරුවන් සහ ප්‍රතිලාභීන් සඳහා පුහුණු අවශ්‍යතා සපුරාලීම අත්‍යාවශ්‍ය කරුණකි. විශේෂයෙන්ම නව තාක්ෂණය සහ නිෂ්පාදන කාලානුරූපීව යාවත්කාලීන වන හෙයින් ඔවුන්ගේ දැනුම ද යාවත්කාලීන විය යුතුයි.

කර්මාන්ත නිෂ්පාදන පිළිබඳ දැනුම ලබාදෙන ප්‍රමුඛ පෙළේ රාජ්‍ය ආයතන ලෙස සැලකිය හැකි කාර්මික තාක්ෂණ ආයතනය (**ITI**), ජාතික ඉංජිනේරු පර්යේෂණ ආයතනය (NERD) වැනි ආයතන අගනුවර කේන්ද්‍ර කොට ස්ථාපිතව තිබීම හා ප්‍රාදේශීය වශයෙන් පුහුණු අවස්ථාවන් ලබාදීමට ඇති හැකියාවන් අවම වීම නිසා ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ට ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගෙන් අදාළ පුහුණු අවස්ථා ලබාගැනීමට ඇති ඉඩකඩ සීමා වී තිබීම හා ඒ සඳහා විශාල කාලයක් ගත කිරීමට සිදුවීම නිසා ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන වෙළඳපොළ අවශ්‍යතාවට සරිලන සැපයුමක් සිදුකළ හැකි වන පරිද්දෙන් ප්‍රසාරණය වීම අවම මට්ටමකින් සිදුවීම කෙරෙහි බලපායි.
එය තිරසර ආර්ථික වර්ධනය කෙරෙහි බලපානු ලබයි.

පරිච්ඡේදය - 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත කාර්ය මණ්ඩලය	පවතින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු/ (අතිරික්තය)**
ජ්‍යෙෂ්ඨ	17	12	05
තෘතීයික	28	25	03
ද්විතීක	694	688	06
ප්‍රාථමික	293	277	16
මුළු ගණන	**1032**	**1002**	**30**

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟයෙහි හෝ අතිරික්තයෙහි බලපෑම

අමාත්‍යාංශයේ පවතින සේවක සංඛ්‍යාව මඟින් ආයතනයේ කාර්යසාධනයට හානියක් නොවන පරිදි කටයුතු කරගෙන යන අතර, කාර්ය මණ්ඩල පුරප්පාඩු කඩිනමින් සපුරා දෙන්නේ නම් පවතින කාර්යසාධනයට වඩා වැඩි කාර්යසාධනයක් කරා ළඟා විය හැකි ය.

6.3 මානව සම්පත් සංවර්ධනය - 2021

අනු අංක	වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවයේ (දේශීය/ විදේශීය)	නිමවුම /ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
01	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම	01	දින 01	5,000.00		දේශීය	ආයතනයේ ගිණුම් අංශයේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම
02	සේවක අභිප්‍රේරණ -බාහිරගත පුහුණුව	110	දින 01	300,000.00		දේශීය	ධනාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීම
03	සේවා අවශ්‍යතාවය මත සම්පූර්ණ කළ යුතු පශ්චාත් උපාධිය	01	අවු. 01	172,500.00		දේශීය	ආර්ථික වර්ධනය සහ සංවර්ධනය, සමීක්ෂණ විධික්‍රම, දේශීය හා විදේශීය වෙළඳාම

අනු අංක	වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවයේ (දේශීය/ විදේශීය)	නිමවුම/ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
04	ග්‍රැෆික් ඩිසයින් පාඨමාලාව	02	මාස 06	49,500.00		දේශීය	පොටෝෂොප්, කොරල්ඩ්‍රෝ, ඉලස්ට්‍රේටර් ඇතුළු ග්‍රැෆික් මෘදුකාංග භාවිතය
05	කාර්යාල සටහන් ලිවීම සහ රාජකාරි ලිපි ලිවීම	20	දින 02	80,000.00		දේශීය	කාර්යාල සටහන් ලිවීම සහ රාජකාරි ලිපි ලිවීමට අදාළ දැනුම
06	කණිෂ්ඨ නිලධාරීන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව	02	අවු. 01	150,000.00		දේශීය	ඉංග්‍රීසි කථනය සහ ලේඛන හැකියාව
07	ගිණුම්කරණ කාර්යභාරය සහ ප්‍රායෝගික භාවිතය	10	දින 02	80,000.00		දේශීය	ආයතනයේ ගිණුම් අංශයේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම
08	වෙබ් ඩිසයින් පාඨමාලාව	02	මාස 03	50,000.00		දේශීය	වෙබ් අඩවි නිර්මාණය සහ පවත්වාගෙන යාම පිළිබඳ දැනුම
09	සහයක කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය	12	දින 02	96,000.00		දේශීය	ප්‍රසම්පාදනය, ටෙන්ඩර් පටිපාටිය, ටෙන්ඩර් ලිපි ලේඛන සැකසීම පිළිබඳ දැනුම

අනු අංක	වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවයේ (දේශීය/ විදේශීය)	නිමවුම/ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
10	රාජ්‍ය ආයතනවල අවසන් ගිණුම් පිළියෙල කිරීම සඳහා බලපාන මූලික ගිණුම්කරණ සංකල්ප හා ගිණුම්කරණ ප්‍රමිත	01	දින 02	7,000.00		දේශීය	ආයතනයේ ගිණුම් අංශයේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම
11	ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය	01	අවු. 02	214,000.00		දේශීය	ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දැනුම
12	නිවාඩු භාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම	01	දින 01	4,000.00		දේශීය	රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ නිවාඩු, ලේඛනගත කිරීම, චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන
13	එක් ගමකට එක් ව්‍යවසායකයෙක් වැඩසටහනට සම්බන්ධ විදාතා නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන	35	දින 01	182,500.00		දේශීය	ධනාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීම් වර්ධනය
14	රාජ්‍ය අංශයේ කාර්යාල ක්‍රම	02	දින 01	10,000.00		දේශීය	රාජ්‍ය ආයතනවල කාර්යාල ක්‍රම පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කාර්යාල ක්‍රම, විනය පටිපාටිය, චක්‍රලේඛ, ආයතන සංග්‍රහයේ විධිවිධාන

අනු අංක	වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවයේ (දේශීය/ විදේශීය)	නිමවුම/ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
15	වාර්ෂික සාමාජික මුදල් ගෙවීම - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය	01		16,000.00		දේශීය	
එකතුව		**201**		**1,416,500**			

පරිච්ඡේදය - 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම්, ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනාකරණ නිරවද්‍ය ක්‍රියාමාර්ග
1.	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1.	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3.	වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නැත		
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නැත		
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නැත		
1.6.	වෙනත්	-		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3.	විගණන විමසුම් ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4.	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5.	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහභාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇත	අනුකූල වේ		
2.6.	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛණ යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7.	බඩු වට්ටෝරු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8.	තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම්, ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනාකරණ නිරවද්‍ය ක්‍රියාමාර්ග
2.9.	හානි හා පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10.	බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11.	උප පත්‍රිකා පොත් (GA — N20) ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3.	**මූල්‍යමය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1.	ආයතනය තුළ මූල්‍යමය බලතල පවරා දී ඇත	අනුකූල වේ		
3.2.	මූල්‍යමය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3.	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1.	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2.	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3.	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4.	වාර්ෂික ඇස්තමේන්තු සකස් කර නියමිත දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5.	වාර්ෂික මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම්, ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනාකරණ නිරවද්‍ය ක්‍රියාමාර්ග
5	**විගණන විමසුම්**			
5.1.	විගණකාධිපතිවරයා විසින් නියම කරනු ලබන දිනට සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1.	මුදල් රෙගුලාසි 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2021 ජූලි මාසය දක්වා පුරප්පාඩුව පැවතීම	ප්‍රධාන අභ්‍යන්තර විගණක පුරප්පාඩුව සම්පූර්ණ වී ඇත
6.2.	සියළුම අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මසක් ඇතුළත පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	කොවිඩ් 19 තත්ත්වය හමුවේ සීමිත නිලධාරීන් ප්‍රමාණයක් සේවයට කැඳවීම මත පිළිතුරක් ලබා දීම ප්‍රමාද වී ඇත	මසක් ඇතුළත පිළිතුරු ලබා දිය යුතු බවට සියළුම අංශ ප්‍රධානීන් දැනුවත් කර ඇත
6.3.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය අනුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
6.4.	මුදල් රෙගුලාසි 134(3) අනුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරණ නිරවද්‍ය ක්‍රියාමාර්ග
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1.	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1-2019 අනුව වසර තුළදී අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පවත්වා තිබීම	අනුකූල නොවේ	ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2021 ජූලි මාසය දක්වා පුරප්පාඩුව පැවතීම සහ කොවිඩ් වසංගත තත්ත්වය මත රැස්වීම් නොපැවැත්වීම	ප්‍රධාන අභ්‍යන්තර විගණක පුරප්පාඩුව සම්පූර්ණ වී ඇත
8	**වත්කම් කළමනාකරණය**			
8.1.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 01/2017, 07 ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය පිළිබඳ තොරතුරු කොම්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලයට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2.	ඉහත චක්‍රලේඛයේ 13 ඡේදය අනුව චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර ඒ පිළිබඳ විස්තර කොම්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණය සිදුකර අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල වේ		
8.5	මු.රෙ. 772 අනුව ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම්, ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනාකරණ නිරවද්‍ය ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සකස් කර නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයක දී අපහරණය කිරීම	අනුකූල නොවේ	අපහරණය කළයුතු වාහන නොමැත	
9.3	වාහන ලොග් පොත් පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම	අනුකූල වේ		
9.4	සියළු වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103, 104, 109 හා 110 අනුව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 3.1 ඡේදයේ විධිවිධාන අනුව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් පසු කල්බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර, සහතික කරගෙන නියමිත දිනට විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නැත		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ මඟින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කොට එම ශේෂයන් මසක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම්, ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනාකරණ නිරවද්‍ය ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	වෙන් කරන ලද ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) අනුව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වසර අවසානයේ ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වසරකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 අනුව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතෙහි ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම්, ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනාකරණ නිරවද්‍ය ක්‍රියාමාර්ග
14.2	මු.රෙ. 371 අනුව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 අනුව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුම්වල ශේෂය මාසිකව භාණ්ඩාගාර පොත් සමඟ සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, ආදායම් ආපසු ගෙවීම නියෝගයන්ට අනුකූලව සිදුකරනු ලැබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් එකතුව තැන්පතු ගිණුමට බැර නොකර සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත සියළු වාර්තා ඉදිරිපත් කර ඇත	අනුකූල වේ		
17	**මහජනයාට තොරතුරු සැපයීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසිවලට අනුව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම්, ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනාකරණ නිරවද්‍ය ක්‍රියාමාර්ග
17.2	වෙබ් අඩවිය හෝ විකල්ප ක්‍රියාමාර්ග හරහා මහජනයාට ආයතනය පිළිබඳ තොරතුරු ලබාදී ඇති අතර මෙම වෙබ් අඩවිය හෝ විකල්ප ක්‍රියාමාර්ග හරහා අගයකිරීම්/ විරෝධතා සඳහා මහජනයාට පහසුකම් සලසා දී තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 හා 10 වන වගන්ති අනුව ද්විවාර්ෂික හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 05/2008 හා 05/2018 (1) අනුව ආයතනය විසින් පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රල්ඛයේ ඇමුණුම 02ට අනුකූලව මානව සම්පත් සැලසුමක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	ඉහත සඳහන් මානව සම්පත් සැලසුමෙහි කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම පැය 12කට නොඅඩු අවම පුහුණු අවස්ථාවක් තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01හි ඇති ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූලවේ/අනුකූල නොවේ	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදි වලක්වා ගැනීමට යෝජනා කරණ නිරවද්‍ය ක්‍රියාමාර්ග
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර මානව සම්පත් සංවර්ධන සැලසුම සකස් කිරීමේ, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමේ හා කුසලතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේ වගකීම පවරා තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද සඳහා ප්‍රතිචාර දැක්වීම**			
20.1	විගණකාධිපතිවරයා විසින් පසුගිය වසර සඳහා විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		